(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 3(5).]

# පාර්ලිමේන්තුවේ අංක 3 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2011 ජූනි මස 10 වැනි සිකුරාදා

## 2011 ජූනි මස 21 වැනි අඟහරුවාදා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0926/’10

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) කොළඹ වරායේ නව කන්ටේනර් පර්යන්තය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත සම්පූර්ණ පිරිවැය;

(ii) එම සම්පූර්ණ පිරිවැයෙන් දේශීයව සපුරා ගන්නා ප්‍රමාණය;

(iii) විදේශීයව සපුරා ගන්නා ප්‍රමාණය;

(iv) එම ව්‍යාපෘතිය සඳහා අරමුදල් ලැබෙන මාර්ග;

(v) සම්පූර්ණ පිරිවැයෙන් ණය වශයෙන් ලැබෙන ප්‍රමාණය;

(vi) ණය මුදල් ප්‍රදානය කරනු ලබන රටවල්, අදාළ පොලී ප්‍රමාණයන් සහ ණය පියවීමේ කාල සීමාවන්;

(vii) සම්පූර්ණ ව්‍යාපෘතිය නිම කිරීමට ගතවන කාල සීමාව;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු සඳහා ශ්‍රමිකයින් බඳවා ගන්නා ක්‍රමය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1201/’11

ගරු එම්. ටී. හසන් අලි මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2004 සුනාමි ව්‍යසනයේදී සයින්දමරුදු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ විනාශයට පත් වූ නිවාස සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සුනාමියෙන් හානියට පත්වූවන්ගේ නිවාස අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා නිවාස 460ක අවශ්‍යතාවයක් තවමත් පවතින බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) වර්ෂ 7කට ආසන්න කාලයක් තිස්සේ තවමත් අවතැන් කඳවුරුවල සිටින සුනාමියෙන් විපතට පත් පුද්ගලයන් හට උපකාරවනු පිණිස ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(ii) සුනාමියෙන් විපතට පත් පුද්ගලයන්ගේ නිවාස අවශ්‍යතා සපුරා අවසන් කිරීම සඳහා නියම කළ හැකි අවසන් දිනය කවරේද?

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1202/'11

ගරු එම්. ටී. හසන් අලි මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ ස්ථිර නිෂ්පාදකවරයකු ලෙස පත් කරනු ලැබීමට අවශ්‍ය කරන මූලික සුදුසුකම කවරේද;

(ii) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ දැනට සේවය කරමින් සිටින ස්ථිර නිෂ්පාදකවරුන් සංඛ්‍යාව කවරේද; සහ

(iii) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ දැනට සේවය කරමින් සිටින එක් එක් ස්ථිර නිෂ්පාදකවරයාගේ සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2011 පෙබරවාරි 19 දිනැති අංක 1693/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.06.10 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2011 අප්‍රේල් 8 දිනැති අංක 1700/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.06.10 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 02 දිනැති අංක 1704/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.06.10 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— රේගු ආඥාපනත යටතේ යෝජනාව,— (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් 2011.06.10 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2011 මැයි 16 දිනැති අංක 1706/2 දරන අති විශේෂ ගැසට් පත්‍රය.)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝගය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 1985 අංක 48 දරන පනතින් සහ 1987 අංක 28 දරන පනතින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 14 වැනි වගන්තිය සහ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 16 දිනැති අංක 1706/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.06.10 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වන) මෝටර් රථ ප්‍රවාහන පනතේ 237 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 9 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (ඈ) ඡේදය යටතේ සහ එම පනතේ 21, 22, 23 සහ 24 වැනි වගන්ති සමග කියවිය යුතු, 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 04 දිනැති අංක 1704/09 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.06.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2010.06.11 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කල යුතුය.

(සෞඛ්‍ය පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2010.09.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කල යුතුය.

(සෞඛ්‍ය පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමිය,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2008,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2010.12.03 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික හා තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කල යුතුය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— පරමාණුක ශක්ති අධිකාරිය වාර්ෂික වාර්තාව 2008,— 1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරි පනතේ 34 වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2010.06.30 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව අනුමත කල යුතුය.

(විදුලිබල හා බලශක්ති පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 1),— 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 26 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 26 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 31003 “රජයේ කර්මාන්තශාලාවේ කළ වැඩ අත්තිකාරම් ගිණුම — රජයේ කර්මාන්ත ශාලාව” වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 260,000,000<br>රු. 280,000,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 280,000,000<br>රු. 268,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 0<br>රු. 2,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2010.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2011.04.29 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 2),— 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද මෙහි පහත උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති නියමයන් අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(මෙම නියමය වලංගු වන්නේ 2010.12.31 වැනි දින දක්වා පමණි)

උපලේඛනය

(අමුණා ඇති උපලේඛනය පරිදිය.)

## 2010 අංක 07 දරන විසර්ජන පනතේ 8 වන වගන්තිය අනුව කරන විධානය

2010 අංක 07 දරන විසර්ජන පනතේ 8 වන වගන්තිය යටතේ 2010 මුදල් වර්ෂය සඳහා රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් බලය දෙන සීමා සංශෝධනය කිරීමේ උපලේඛනය.

| අනුක්‍රමික අංකය | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | විෂය අංකය | ii රජයේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමාව | | iii රජයේ කටයුතු පිළිබඳ ගිණුම්වලට බැර කළ යුතු ලැබීම්වල අවම සීමාව | | iv රජයේ කටයුතුවල හර ශේෂයන්ගේ උපරිම සීමාව | | නියෝග අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | සිට | දක්වා | සිට | දක්වා | |
| 1 | පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා | 17401 | - | - | 100,000 | 350,000 | 3,000,000 | 10,000,000 | 1 |
| 2 | ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යවරයා | 12301 | - | - | 7,400,000 | 4,000,000 | - | - | 2 |
| 3 | පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යවරයා | 14001 | - | - | 5,800,000 | 4,600,000 | - | - | 3 |
| 4 | ප්‍රවාහන අමාත්‍යවරයා | 11401 | - | - | 8,200,000 | 4,500,000 | - | - | 4 |
| 5 | ආපදා කළමනාකරණ අමාත්‍යවරයා | 10601 | - | - | - | - | 8,000,000 | 11,500,000 | 5 |
| 6 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කොළඹ | 25501 | - | - | 35,000,000 | 29,000,000 | 170,000,000 | 175,000,000 | 6 |
| 7 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ | 25901 | - | - | 32,000,000 | 26,000,000 | - | - | 7 |
| 8 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/කච්චේරිය - මඩකලපුව | 26901 | - | - | - | - | 50,000,000 | 82,000,000 | 8 |
| 9 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/කච්චේරිය - ත්‍රිකුණාමලය | 27101 | - | - | 15,000,000 | 13,500,000 | - | - | 9 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 10 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අනුරාධපුරය | 27401 | - | - | 40,000,000 | 30,000,000 | - | - | 10 |
| 11 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මොණරාගල | 27701 | - | - | 21,000,000 | 19,000,000 | - | - | 11 |
| 12 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - රත්නපුර | 27801 | - | - | - | - | 146,000,000 | 148,000,000 | 12 |
| 13 | වරාය හා ගුවන් සේවා අමාත්‍යවරයා | 11301 | - | - | 5,600,000 | 5,159,000 | - | - | 13 |
| 14 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 30701 | - | - | - | - | 65,000,000 | 95,000,000 | 14 |
| 15 | ප්‍රජා විශෝධන දෙපාර්තමේන්තුව | 32601 | - | - | - | - | 13,000,000 | 20,000,000 | 15 |
| 16 | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | 02201 | - | - | 292,000 | 0 | - | - | 21 |
| 17 | වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 24401 | - | - | 2,000,000 | 1,980,000 | - | - | 22 |
| 18 | නීති කටයුතු දෙපාර්තමේන්තුව | 32301 | - | - | - | - | 1,000,000 | 1,102,769 | 23 |

අත්සන්කලේ. මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා

2011 අප්‍රේල් 29 දින
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

***** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

## 2011 ජූනි මස 22 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0905/'10

ගරු එම්. ටී. හසන් අලි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වසර පහකට අධික කාලයක් නැගෙනහිර පළාතේ කොන්ත්‍රාත් පදනම යටතේ අඛණ්ඩව සේවයකරමින් සිටි ඉංග්‍රීසි ගුරුවරුන් පිරිසක් සඳහා අදියර දෙකකින් (රා.ප.චක්‍රලේඛ අංක 13/2005 සහ 21/2006 යටතේ) ස්ථිර පත්වීම් පිරිනමන ලද බවත්;

(ii) ඉහත රා.ප. චක්‍රලේඛවලට අනුව, අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ ED/2/29/4/1/46 හා 2005/7/19 දිනැති ලිපියේ සඳහන් උපදෙස් පරිදි, 2005/7/28 දින සිට ඉහත ගුරු පිරිසෙන් කොටසකට පත්වීම් ලබාදී ඇති නමුත්, 2003 - 2004 වර්ෂයේ සිට කොන්ත්‍රාත් පදනම යටතේ අඛණ්ඩව සේවය කරන 50 දෙනෙකු පමණ ගුරු පිරිසකට මේ දක්වා ස්ථිර පත්වීම් ලබාදී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, අම්පාර, අක්කරපත්තුව සහ සම්මන්තුරේ යන අධ්‍යාපන කලාපවලට අයත් පාසල්වල සේවයේ නියුතු එවැනි ගුරුවරුන්ට ස්ථිර පත්වීම් ලබා දීමටත්;

(ii) මඩකලපුව දිස්ත්‍රික්කයේ පඩ්ඩිරිප්පු, කල්කුඩා සහ මඩකලපු යන අධ්‍යාපන කලාපවලට අයත් පාසල්වල සේවයේ නියුතු එවැනි ගුරුවරුන්ට ස්ථිර පත්වීම් ලබාදීමටත්;

නොපමාව පියවර ගන්නේද, යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0942/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කය තුළ ජාතික සවිය හා ගම නැගුම ව්‍යාපෘති යටතේ සංවර්ධන කටයුතු ආරම්භ කර ඇති ග්‍රාමීය මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iv) එම ව්‍යාපෘතීන් යටතේ ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0977/'10

ගරු එම්. ටී. හසන් අලි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අඩු පහසුකම් සහිත පාසල් ලෙස හඳුනාගෙන තිබෙන පළාත් සභා සහ මධ්‍යම රජය යටතේ පවතින පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් අතුරින් මුස්ලිම් පාසල් හා වතු පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පාසල්වල දියුණුව උදෙසා ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන වැඩ සටහන් දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0981/'10

ගරු එම්. ටී. හසන් අලි මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) සෞදි අරාබි රාජ්‍යයේ ක්‍රියාත්මක වන නීතිය ඉස්ලාමීය ෂරීආ නීතිය බවත්;

(ii) ඉස්ලාමීය ෂරීආ නීතිය අනුව අධිකරණය විසින් යම් පුද්ගලයෙකුට මරණ දඬුවමක් නියම කිරීමේදී අදාළ වැරදිකරු නීති විරෝධී ක්‍රියාව හෝ අපරාධය සිදුකරන දිනය වන විට වයස අවුරුදු 18 ක් සම්පූර්ණවීම සැලකිල්ලට ගන්නා බවත්;

(iii) මේ වන විට සෞදි අරාබියේදී මරණ දඬුවම නියමවී ඇති රිසානා නෆීක් මෙනෙවිය එම අපරාධ චෝදනාවට ලක්වන අවස්ථාවේ දී ඇගේ සැබෑ වයස අවුරුදු 17ක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ නම්, රිසානා මෙනෙවියට ව්‍යාජ උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත, ශ්‍රී ලංකා ගමන් බලපත්‍ර නිකුත් කිරීමට සහායවූ නිලධාරීන්ට, ශ්‍රී ලංකා ගමන් බලපත්‍ර අයදුම්පත්‍රය සහතිකය කරන ලද සාම විනිසුරුවරයාට සහ විදේශගතවීමට සහායවූ විදේශ නියෝජිත ආයතන හිමියාට එරෙහිව මේ වනවිටත් ගෙන ඇති පියවර කවරේද;

(ii) රිසානාට එරෙහිව එරටේ අධිකරණයේ නඩු විභාගය පැවැත්වෙන අවස්ථාවේදී නිසි පරිදි කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත්වූ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ඇයට එම දඬුවම හිමිවීම සම්බන්ධ සම්පූර්ණ වගකීම බාර ගත යුතු බව පිළිගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2011 ජූනි මස 23 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0624/'10

ගරු ආර්. යෝගරාජන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) කොළඹ 12, හුසේනියා මාවත, අංක 45 හි පිහිටි හමීඩ් අල් හුසේනියා විද්‍යාලයෙහි බරපතළ ගුරු හිඟයක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පාසල සඳහා අනුමත වී ඇති එක් එක් විෂය සඳහා වූ සිංහල සහ දෙමළ මාධ්‍ය ගුරුවරු සංඛ්‍යාව කවරේද;

(ii) එක් එක් විෂය සඳහා එක් එක් මාධ්‍යයෙන් සිටින ගුරුවරු සංඛ්‍යාව කවරේද;

(iii) එක් එක් විෂය සඳහා එක් එක් මාධ්‍යයෙන් පවතින ගුරු හිඟය කොපමණද;

(iv) ඉහත සඳහන් ගුරු හිඟයට පිළියම් යෙදීම පිණිස ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) එම ක්‍රියාමාර්ග ගනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) රාජකීය, ආනන්ද සහ නාලන්ද විද්‍යාලවල ගුරු අතිරික්තයක් පවතින බව එතුමා දන්නෙහිද?

(ඈ) (i) ඉහත (ඇ) කොටසෙහි සඳහන් පාසල්වල සිටින අතිරික්ත ගුරුවරු සංඛ්‍යාව එක් එක් මාධ්‍ය අනුව සහ එක් එක් විෂය අනුව කොපමණද;

(ii) පවතින පුරප්පාඩු පිරවීම සඳහා මෙම අතිරික්ත ගුරුවරු හමීඩ් අල් හුසේනියා විද්‍යාලයට මාරු කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1150/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකු/පුල්මුඩේ මුස්ලිම් මහ විද්‍යාලයෙහි 2010 වර්ෂයේදී ගුරුවරුන් 68 දෙනෙකු සේවය කළ බවත්;

(ii) වර්ෂ අටක් එකම පාසැලෙහි සේවය කර ඇති ගුරුවරුන් ස්ථාන මාරුකිරීමේ ගුරු ස්ථානමාරු ප්‍රතිපත්තිය යටතේ එම පාසලේ ගුරුවරුන් 30 දෙනෙකු ස්ථානමාරු ලද බවත්;

(iii) අලුතින් ස්ථානමාරු ලැබූ ගුරුවරුන් හත් දෙනෙකු පාසලට පත්කොට ඇති බවත්;

(iv) 1500කට අධික ශිෂ්‍ය සංඛ්‍යාවක් අධ්‍යාපනය ලබන මෙම පාසැලට ගුරුවරුන් 72 දෙනෙකු අවශ්‍ය වෙතත්, දැනට ඉගැන්වීම් කටයුතු කරන ගුරුවරුන්ගේ ගණන 42ක් පමණක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ත්‍රිකු/පුල්මුඩේ මුස්ලිම් මහ විද්‍යාලයේ පවතින එම ගුරු හිඟය මඟහැරවීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2011 ජුලි මස 05 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0285/'10

ගරු රවී කරුණානායක මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජල සම්පාදන සහ ජලාපවහන අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා කවරේද;

(ii) ඉහත කී අමාත්‍යාංශයේ සමස්ත මාසික සහ වාර්ෂික පිරිවැය කොපමණද;

(iii) ස්ථිර කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාව සහ ඔවුන්ට මාසිකව ගෙවනු ලබන සමස්ත වැටුප් සහ දීමනා ප්‍රමාණය කොපමණද; සහ

(iv) ජල සම්පාදන සහ ජලාපවහන අමාත්‍යතුමාගේ, නියෝජ්‍ය අමාත්‍යතුමාගේ, එම කාර්ය මණ්ඩලවල වත්මන් සමස්ත මාසික පිරිවැය කොපමණද;

යන්න 2010 සහ 2011 වසරවලට අදාළව වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0717/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වර්ෂ 1994 සිට මේ දක්වා කටුනායක ගුවන්තොටුපලේ තිබෙන තීරුබදු රහිත වෙළෙඳසැල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් තීරුබදු රහිත වෙළෙඳසැල් ලබා දී ඇති හෝ බදු දී ඇති පුද්ගලයන්ගේ නම් සහ ලිපිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම සාප්පු සංකීර්ණ ලබා දී ඇති මුළු මුදල හෝ ස්ථිර වශයෙන් පවරා දීමට රජය ලබා ගත් මුදල් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කටුනායක ගුවන්තොටුපල තුළ නව සාප්පු සංකීර්ණයක් ඉදි කිරීම සඳහා කටයුතු යොදා තිබේද;

(ii) එසේ නම්, එය ආරම්භ කරන දිනය කවරේද;

(iii) ඒ යටතේ ඉදිකිරීමට අපේක්ෂිත වෙළෙඳසැල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1163/'11

ගරු අනුර දිසානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 දී දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ගිනි නිවන උපකරණ මිලදී ගැනීමක් කර තිබේද;

(ii) එසේ නම්, මිලදී ගත් ගිනි නිවන උපකරණ සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) දුම්රිය මැදිරි සඳහා සවි කිරීමට ඉහත පරිදි මිලදී ගත් ගිනි නිවීමේ උපකරණ කල් ඉකුත් වූ ඒවා බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එවැනි තත්ත්වයක් ඇතිවීමට වගකිව යුතු නිලධාරීන්ට අදාළව පරීක්ෂණයක් කර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0656/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රටෙහි තිබෙන විශාලතම රජයේ දෙපාර්තමේන්තු දහය කවරේද;

(ii) ඒවා විශාලතම දෙපාර්තමේන්තු දහය අතරට ගැනෙන ලෙස සලකන්නේ කෙසේද;

(iii) එම එක් එක් ආයතනයට යොදවා ඇති ප්‍රාග්ධන ප්‍රමාණය සහ ඒවායේ දැනට සිටින සේවක සංඛ්‍යාව කවරේද;

(iv) මෙම එක් එක් දෙපාර්තමේන්තුව අද දක්වා වූ පසුගිය වර්ෂ පහක කාලය තුළ ලැබූ ලාභය හෝ පාඩුව වාර්ෂික පදනමින් කොපමණද; සහ

(v) එම එක් එක් දෙපාර්තමේන්තුවේ වෙළෙඳපල කොටස කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත දෙපාර්තමේන්තු අතරින් පාඩු ලබන ආයතන ලාභ ලබන ආයතන බවට පත් කළ හැකිද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0732/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2006 සිට මේ දක්වා විදේශයන්හිදී මිය ගිය විදේශගත ශ්‍රමිකයන් සංඛ්‍යාව එක් එක් මාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම මරණවලට හේතු කවරේද;

(iii) එසේ මිය ගිය අයගෙන් ශ්‍රී ලංකාවට ගෙන්වා ගත් මෘත දේහ සංඛ්‍යාව කොපමණද;

(iv) මෘත දේහ ගෙන්වා ගැනීමට නොහැකි වූයේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත මිය ගිය අය වෙනුවෙන් මෙතෙක් වන්දි ලබා දී ඇති අවස්ථා සංඛ්‍යාව කොපමණද;

(ii) මිය ගිය අය වෙනුවෙන් වන්දි ලබා නොදුන් අවස්ථා වේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1169/'11

ගරු අනුර දිසානායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දෙහිවල ගුවන් පාලම විවෘත කළ දිනය හා කවුරුන් විසින් විවෘත කළේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දෙහිවල ගුවන් පාලම ඉදිකිරීමෙන් සපුරාගැනීමට අපේක්ෂා කළ අරමුණු කවරේද;

(ii) දැනට එම පාලමෙන් බර වාහන ගමන් කිරීම තහනම් කර තිබේද;

(iii) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ වන විට ඉහත ගුවන් පාලම මතින් බර වාහන ධාවනය තහනම් කර ඇත්නම්, එම පාලම ඉදිකිරීමෙන් ඉටු කර ගැනීමට අපේක්ෂා කළ අරමුණු ඉටුවී නොමැති බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0657/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රට තුළ ඇති රජයට අයත් විශාලතම ව්‍යාපාර 30 කවරේද;

(ii) ඒවා රජය සතු විශාලතම ව්‍යාපාර 30 ලෙස සලකනු ලබන්නේ කවර පදනමකින්ද;

(iii) එක් එක් ආයතනයෙහි ආයෝජනය කරන ලද මූලධන ප්‍රමාණය හා දැනට සිටින සේවක සංඛ්‍යාව කොපමණද;

(iv) මේ දක්වා වූ පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් ආයතනයෙහි ලාභ හෝ පාඩු වාර්ෂික පදනමින් කොපමණද;

(v) රජය සතු එක් එක් ව්‍යාපාරයෙහි වෙළඳපොළ කොටස කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් ව්‍යාපාර අතරින් පාඩු ලබන සෑම ආයතනයක්ම ලාභ ලබන තත්ත්වයට පත් කළ හැකිද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0965/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේදී අත්අඩංගුවට ගත් විශ්වවිද්‍යාල සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අතරින් බන්ධනාගාර ගත කළ සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන් බන්ධනාගාරගත කිරීමට හේතු වූ වැරදි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2010 වර්ෂයේදී පන්ති තහනමට ලක් වූ සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පන්ති තහනම් කිරීම්වලට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2011 ජූලි මස 05 වැනි අඟහරුවාදා)**

0199/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතට අනුව ආරම්භයේ දී කොමිෂන් සභාව සතු වූ මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මේ වන විට විකුණා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එයින් අක්කර 5 ට වැඩි විකුණුම්වල ඉඩමේ නම, ප්‍රමාණය, විකුණූ දිනය, ගැනුම්කරු සහ විකුණූ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉතිරි ඉඩම්වලින් කිසිවක් දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දී තිබේද;

(ii) එසේ නම්, ලබාදුන් ඉඩමේ නම, බදු ගැනුම්කරු හා ලබාදුන් දිනය, ලබාගත් බදු මුදල සහ බදු අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එසේ නොවිකුණා හෝ බදු නොදී ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒවා ග්‍රාම නිලධාරී වසම් අනුව අක්කර වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් පිහිටි ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0200/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මහියංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතට අනුව ආරම්භයේ දී කොමිෂන් සභාව සතු වූ මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මේ වන විට විකුණා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එයින් අක්කර 5 ට වැඩි විකුණුම්වල ඉඩමේ නම, ප්‍රමාණය, විකුණූ දිනය, ගැනුම්කරු සහ විකුණූ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉතිරි ඉඩම්වලින් කිසිවක් දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දී තිබේද;

(ii) එසේ නම්, ලබාදුන් ඉඩමේ නම, බදු ගැනුම්කරු හා ලබාදුන් දිනය, ලබාගත් බදු මුදල සහ බදු අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එසේ නොවිකුණා හෝ බදු නොදී ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒවා ග්‍රාම නිලධාරී වසම් අනුව අක්කර වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් පිහිටි ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0201/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතට අනුව ආරම්භයේ දී කොමිෂන් සභාව සතු වූ මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මේ වන විට විකුණා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එයින් අක්කර 5 ට වැඩි විකුණුම්වල ඉඩමේ නම, ප්‍රමාණය, විකුණූ දිනය, ගැනුම්කරු සහ විකුණූ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉතිරි ඉඩම්වලින් කිසිවක් දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දී තිබේද;

(ii) එසේ නම්, ලබාදුන් ඉඩමේ නම, බදු ගැනුම්කරු හා ලබාදුන් දිනය, ලබාගත් බදු මුදල සහ බදු අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එසේ නොවිකුණා හෝ බදු නොදී ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒවා ග්‍රාම නිලධාරී වසම් අනුව අක්කර වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් පිහිටි ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0202/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මීගහකිවුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතට අනුව ආරම්භයේ දී කොමිෂන් සභාව සතු වූ මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මේ වන විට විකුණා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එයින් අක්කර 5 ට වැඩි විකුණුම්වල ඉඩමේ නම, ප්‍රමාණය, විකුණූ දිනය, ගැනුම්කරු සහ විකුණූ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉතිරි ඉඩම්වලින් කිසිවක් දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දී තිබේද;

(ii) එසේ නම්, ලබාදුන් ඉඩමේ නම, බදු ගැනුම්කරු හා ලබාදුන් දිනය, ලබාගත් බදු මුදල සහ බදු අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එසේ නොවිකුණා හෝ බදු නොදී ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒවා ග්‍රාම නිලධාරී වසම් අනුව අක්කර වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් පිහිටි ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0203/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතට අනුව ආරම්භයේ දී කොමිෂන් සභාව සතු වූ මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මේ වන විට විකුණා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එයින් අක්කර 5 ට වැඩි විකුණුම්වල ඉඩමේ නම, ප්‍රමාණය, විකුණූ දිනය, ගැනුම්කරු සහ විකුණූ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉතිරි ඉඩම්වලින් කිසිවක් දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දී තිබේද;

(ii) එසේ නම්, ලබාදුන් ඉඩමේ නම, බදු ගැනුම්කරු හා ලබාදුන් දිනය, ලබාගත් බදු මුදල සහ බදු අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එසේ නොවිකුණා හෝ බදු නොදී ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒවා ග්‍රාම නිලධාරී වසම් අනුව අක්කර වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් පිහිටි ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0204/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතට අනුව ආරම්භයේ දී කොමිෂන් සභාව සතු වූ මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මේ වන විට විකුණා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එයින් අක්කර 5 ට වැඩි විකුණුම්වල ඉඩමේ නම, ප්‍රමාණය, විකුණූ දිනය, ගැනුම්කරු සහ විකුණූ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉතිරි ඉඩම්වලින් කිසිවක් දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දී තිබේද;

(ii) එසේ නම්, ලබාදුන් ඉඩමේ නම, බදු ගැනුම්කරු හා ලබාදුන් දිනය, ලබාගත් බදු මුදල සහ බදු අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එසේ නොවිකුණා හෝ බදු නොදී ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒවා ග්‍රාම නිලධාරී වසම් අනුව අක්කර වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් පිහිටි ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2011 ජූලි මස 06 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0833/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කටුනායක ගුවන් තොටුපලේ රාජකාරි කටයුතු සඳහා යොදවා ඇති ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) ගුවන් තොටුපලේ රාජකාරියේ යෙදී සිටින එම සේවකයින් සපුරාලිය යුතු සුදුසුකම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කටුනායක ගුවන් තොටුපලේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ රාජකාරි කටයුතු සඳහා එම දෙපාර්තමේන්තුවට අයත් නොවන බාහිර පුද්ගලයින් යොදවා තිබේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iii) එම පුද්ගලයන්ගේ සුදුසුකම් කවරේද;

(iv) එවැනි පිරිසක් සේවයේ යෙදවීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0721/'10

ගරු රවී කරුණානායක මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රබර් පර්යේෂණ ආයතනයේ ව්‍යාපෘති පිහිටා ඇති ස්ථාන කවරේද;

(ii) එවැනි එක් ඒකකයක් කළුතර දිස්ත්‍රික්කයේ පිහිටා තිබේද;

(iii) එසේ නම්, එම පිහිටි ස්ථානයේ නම කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) විගණකාධිපතිගේ විමසීමට ලක්වූ 2000 වර්ෂයේ රබර් පර්යේෂණ ආයතනයේ පර්යේෂණ ව්‍යාපෘති පිරිවැය, අතිරේක වත්කම් නොමැතිව රු. මිලියන 700-800 ප්‍රමාණයක් වූයේද;

(ii) නොඑසේ නම්, ඉහත කී වර්ෂයේ පර්යේෂණ සඳහා වැය කළ මුදලේ නිවැරදි අගය කොපමණද;

(iii) එම කාරණය අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශණ කොමිසමට යොමු කරනු ලැබුවේද;

(iv) එසේ නම්, එම විමර්ශනයෙහි ප්‍රතිඵල කවරේද;

යන්නද එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ගිවිසුමකට එළඹෙන අවස්ථාවේ වැය කිරීමට මුදල් නොතිබූ නමුත් මෙම ආයතනය සඳහා මුදල් වෙන් කළ ආයතන කවරේද යන්න එතුමා මෙම සභාවට දැනුම් දෙන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0722/'10

ගරු රවී කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009.01.01 දින සිට මේ දක්වා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 16 වගන්තිය සහ 17 වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුම්වලට එළඹීමට ඉල්ලා සිටි රාජ්‍ය ව්‍යාපාර සංඛ්‍යාව සහ ගිවිසුම්වලට එළඹී ඇති සමාගම් සංඛ්‍යාව වාර්ෂික සහ ආංශික පදනමින් කවරේද;

(ii) ඉහත (අ)(i) හි සඳහන් ව්‍යාපාර අතරින් මේ වනවිට වාණිජ මෙහෙයුම් අරඹා ඇති ව්‍යාපාර සංඛ්‍යාව කවරේද;

(iii) ඉහත (අ)(i) හි පරිදි සිදුකර ඇති ආයෝජන ප්‍රමාණයේ වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් සමාගම් විසින් භුක්ති විඳිනු ලබන බදු විරාමයන් කවරේද;

(ii) 2006.01.01 සිට 2008.12.31 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ලියාපදිංචි වූ සහ මෙහෙයුම් ඇරඹූ සමාගම් සංඛ්‍යාව වාර්ෂික පදනමින් සහ ආයෝජන මණ්ඩලයේ එක් එක් අංශ පදනමින් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0966/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සීමාසහිත ලංකා සළුසල ආයතනයේ වර්තමාන සභාපතිවරයා පත් කළ බලධාරියාගේ නම කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම සභාපතිවරයාගේ,

(i) සම්පූර්ණ නම හා වයස;

(ii) අධ්‍යාපන සුදුසුකම්;

(iii) පෙර සේවය කළ ස්ථානය, තනතුර හා වෘත්තීය පළපුරුද්ද;

(iv) වත්මන් මාසික වැටුප හා ලැබෙන වෙනත් දීමනා;

කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2011 ජූලි මස 06 වැනි බදාදා)**

0175/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) තංගල්ල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, එම එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය, ඉඩමේ ස්වභාවය හා වාර්ෂික ආදායම කොපමණද;

(iii) එම ඉඩම්වල අයිතිය නිත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(iv) ඒ කවර කාර්යයක් සඳහා, කවර පදනමකින්ද;

(v) එම පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය, කාල සීමාව හා කොමිෂන් සභාවට වාර්ෂිකව ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නිත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම්, ඉඩම් ප්‍රමාණය සහ ඒ කවදා සිටද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා 2009.08.01 දිනට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම, ලිපිනය සහ ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0668/'10

ගරු අනුර දිසානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පසුගිය වර්ෂ 5 තුළ එක් එක් වර්ෂයේදී,

(i) ආනයනය කළ සහල්, පිටි, සීනි, පළතුරු, කුළු බඩු ඇතුළු සියලු ආහාර ද්‍රව්‍යයන්ගේ ප්‍රමාණයන්;

(ii) එම ද්‍රව්‍ය ආනයනය කළ රටවල්;

(iii) මෙරටට ගෙන්වන ලද ආයතන හා පුද්ගලයින්;

(iv) රටට ගොඩබාන විට එක් එක් ආහාර වර්ගයේ වටිනාකම;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0176/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය, ඉඩමේ ස්වභාවය හා වාර්ෂික ආදායම කොපමණද;

(iii) එම ඉඩම්වල අයිතිය නිත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(iv) ඒ කවර කාර්යයක් සඳහා කවර පදනමකින්ද;

(v) එම පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය, කාල සීමාව හා කොමිෂන් සභාවට වාර්ෂිකව ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නිත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම් ඔවුන්ගේ නම්, ඉඩම් ප්‍රමාණය සහ ඒ කවදා සිටද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා 2009.08.01 දිනට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම, ලිපිනය සහ ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0858/'10

ගරු අජිත් කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) බස්නාහිර, සබරගමුව, වයඹ, මධ්‍යම, ඌව, උතුරු මැද, නැගෙනහිර සහ උතුරු පළාත් සභාවන් තුළ මධ්‍යම රජයට හා පළාත් සභාවට අයත් පාසල්හි සේවය කරන ගුරුවරුන්ට හිඟ වැටුප් ගෙවීමට තිබේද යන්න එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එසේ හිඟ වැටුප් ගෙවීමට තිබේ නම්, 2010.01.01 දින වනවිට ඒ ඒ පළාත් මට්ටමින් ගුරුවරුන්ට ගෙවිය යුතු හිඟ වැටුප් ප්‍රමාණයන්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම හිඟ වැටුප් ගෙවීමට රජය මඟින් මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iii) එසේ වෙන්කර නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) හිඟ වැටුප් නොගෙවීමෙන් එම ගුරුවරුන්ට අසාධාරණයක් වී ඇති බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම ගුරුවරුන්ට හිඟ වැටුප් ගෙවනු ලබන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0974/'10

ගරු අජිත් කුමාර මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2005 - 2010 දක්වා කාල සීමාව තුළ විදේශ රටවල සේවයේ නියුක්ත වී ඇති ශ්‍රී ලාංකිකයින්ගේ සංඛ්‍යාව එක් එක් රට හා රැකියා ක්ෂේත්‍රය අනුව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2005 - 2010 දක්වා කාලසීමාවේදී විදේශ සේවා නියුක්තිය මගින් ශ්‍රී ලංකාව උපයන ලද ආදායම කොපමණද;

(ii) එම ආදායම, සමස්ත රාජ්‍ය ආදායමේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0975/'10

ගරු අජිත් කුමාර මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන විදේශ රැකියා නියෝජිත ආයතනයක් ලියාපදිංචි කළ යුතු රාජ්‍ය ආයතනය කුමක්ද;

(ii) එසේ ලියාපදිංචිවීම සඳහා සපුරාලිය යුතු කොන්දේසි කවරේද;

(iii) මේ වන විට ලියාපදිංචි වී ඇති විදේශ රැකියා නියෝජිතායතන සංඛ්‍යාව, ඒවායේ නම් හා ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ලියාපදිංචි නොවූ විදේශ රැකියා නියෝජිත ආයතන හඳුනාගෙන තිබේ නම්, එම ආයතන සංඛ්‍යාව, ඒවායේ නම් හා ලිපිනයන් කවරේද;

(ii) එවැනි නියෝජිතායතන සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති හා ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) වර්ෂ 2005 සිට 2010 දක්වා කාල සීමාවේදී ලියාපදිංචි වී ඇතත් පසු කාලයේදී මූලික කොන්දේසි කඩකිරීම නිසා ලියාපදිංචිය අවලංගු කර හෝ නීතිමය පියවර ගන්නා ලද විදේශ රැකියා නියෝජිතායතන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙරට ක්‍රියාත්මක වන විදේශ රැකියා උප නියෝජිතායතන තිබේද;

(ii) එවැනි ආයතන විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ හෝ රජයේ වෙනත් ආයතනයක ලියාපදිංචි කළ යුතුද;

(iii) එසේ නම්, ඊට අදාළ කොන්දේසි කවරේද;

(iv) එසේ ලියාපදිංචි කර ඇති උප නියෝජිතායතන සංඛ්‍යාව, ඒවායේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2011 ජූලි මස 07 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0724/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ සිටින සමෘද්ධි ණය ලබාගත් සංඛ්‍යාව;

(ii) එම ණය ලබා දී ඇති පොලී අනුපාතිකය;

(iii) ණය ලබා දීමේ දී අනුගමනය කරන ක්‍රියා පිළිවෙත;

(iv) මේ වන විට අය කර ගැනීමට ඇති මුදල් ප්‍රමාණය;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ණය ලබාගත් සමෘද්ධිලාභීන්ගෙන් ණය අයකර ගැනීමේදී නිලධාරීන් අත්තනෝමතික ලෙස කටයුතු කරන බව එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, ඒ පිළිබඳව ගන්නා ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0586/'10

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නිදහස ලබාගත් දා සිට මේ දක්වා වූ කාලය තුළ ශ්‍රී ලංකා රජය වෙනත් රටවලට ඉඩම් තෑගි ලෙස ලබාදී තිබේද;

(ii) එසේ නම්, ලබා දෙන ලද ඉඩම්වල ප්‍රමාණය පර්චස් හෝ අක්කර කොපමණද;

(iii) එසේ ඉඩම් ලබා දීමේ අරමුණ කවරේද;

(iv) එසේ මෙරට ඉඩම් ලබා දුන් රටවලින් ඒ අයුරින්ම තෑගි ලෙස ඉඩම් ශ්‍රී ලංකාවට ලැබී තිබේද;

(v) එසේ නම්, එම ඉඩම් ලබා දුන් රටවල නම්, ඒවා ලබා දුන් දිනයන් සහ එසේ ලැබුණු ඉඩම් වල ප්‍රමාණයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0967/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත සළුසල ආයතනයේ වර්තමාන සේවකයින් සංඛ්‍යාව;

(ii) 2009 වර්ෂයේදී සේවක අතිරික්තය නිසා අනිවාර්ය නිවාඩු යවන ලද සේවක සංඛ්‍යාව;

(iii) සේවක අතිරික්තය නිසා සේවකයින් අනිවාර්යය නිවාඩු යවා තිබියදීත් අලුතින් සේවකයින් බඳවාගෙන තිබේ නම්, එම සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම අලුතින් පත්වීම් ලද එක් එක් සේවකයාට ලැබෙන සම්පූර්ණ මාසික වැටුප වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඊට අමතරව ඔවුන්ට ලැබෙන දීමනා කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) වර්ෂ 2009 සිට මේ දක්වා සළුසල ආයතනයේ වියදමින් පවත්වා ඇති ප්‍රිය සම්භාෂණ හෝ වැඩමුළු කවරේද;

(ii) එම එක් එක් වැඩසටහන පැවැත්වීමට හේතු වූ කරුණු කවරේද;

(iii) එම එක් එක් වැඩ සටහන් සඳහා වැය වූ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0723/'10

ගරු රවී කරුණානායක මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ විධිවිධාන ප්‍රකාරව අතිගරු ජනාධිපතිතුමා යටත් පිරිසෙයින් වර්ෂයකට වරක් හෝ අපනයන සභාවේ රැස්වීමක මුලසුන දරා තිබේද;

(ii) රජයේ අපනයන ප්‍රතිපත්ති සම්පාදනය සිදු කරන පාර්ශ්වයන් කවරේද;

(iii) එබඳු ප්‍රතිපත්ති සම්පාදනයක් අවසන් වරට සිදු කරන ලද දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එමෙන්ම,

(i) 2009 වර්ෂයේදී සහ 2010 වර්ෂයේදී, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 13 වගන්තිය ප්‍රකාරව මුදල් ප්‍රතිපාදන ලබාදුන් සමාගම් වල නම් සහ එම එක් එක් සමාගමට එක් එක් වර්ෂයේදී ලබා දුන් මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) 2009 සහ 2010 වර්ෂයන්හිදී සෙස් බදු ප්‍රතිපූරණය කිරීමට අමතරව රජය විසින් අපනයන සංවර්ධන මණ්ඩලය වෙත ලබා දුන් මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0976/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත ගෝල්ඩන් රිලීෆ් රිසෝසස් ආයතනය සමාගම් පනත යටතේ ලියාපදිංචි වී තිබේද;

(ii) එසේ නම්, එම ආයතනය ලියාපදිංචි වී තිබෙන්නේ කවර අරමුණු අරභයාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සීමාසහිත ගෝල්ඩන් රිලීෆ් රිසෝසස් නමැති සමාගම මාර්ග සංවර්ධන අධිකාරියේ කොන්ත්‍රාත්කරුවෙකු ලෙස ලියාපදිංචි වී තිබේද;

(ii) එසේ නම්, එය ලියාපදිංචි කර ඇත්තේ කවර කොන්ත්‍රාත්කරුවන්ගේ ශ්‍රේණිය යටතේද;

(iii) එම සමාගමේ සභාපතිවරයා හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(v) එම සමාගම විසින් මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ දකුණු පළාතේ සිදුකර ඇති ප්‍රධාන ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2011 ජූලි මස 07 වැනි බ්‍රහස්පතින්දා)**

0177/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ඕකේවෙල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය, ඉඩමේ ස්වභාවය හා වාර්ෂික ආදායම කොපමණද;

(iii) එම ඉඩම්වල අයිතිය නිත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(iv) ඒ කවර කාර්යයක් සඳහා, කවර පදනමකින්ද;

(v) එම පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය, කාල සීමාව හා කොමිෂන් සභාවට වාර්ෂිකව ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නිත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම, ඉඩම් ප්‍රමාණය සහ ඒ කවදා සිටද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා 2009.08.01 දිනට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම්, ලිපිනයන් සහ ඉඩම් ප්‍රමාණයන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0178/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) කටුවන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය, ඉඩමේ ස්වභාවය හා වාර්ෂික ආදායම කොපමණද;

(iii) එම ඉඩම්වල අයිතිය නිත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(iv) ඒ කවර කාර්යයක් සඳහා කවර පදනමකින්ද;

(v) එම පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය, කාල සීමාව හා කොමිෂන් සභාවට වාර්ෂිකව ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නීත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම්, ඉඩම් ප්‍රමාණය සහ ඒ කවදා සිටද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා 2009.08.01 දිනට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම්, ලිපිනයන් සහ ඉඩම් ප්‍රමාණයන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0179/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය, ඉඩමේ ස්වභාවය හා වාර්ෂික ආදායම කොපමණද;

(iii) එම ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(iv) ඒ කවර කාර්යයක් සඳහා කවර පදනමකින්ද;

(v) එම පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය, කාල සීමාව හා කොමිෂන් සභාවට වාර්ෂිකව ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නීත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම්, ඉඩම් ප්‍රමාණය සහ ඒ කවදා සිටද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා 2009.08.01 දිනට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම්, ලිපිනයන් සහ ඉඩම් ප්‍රමාණයන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0180/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වීරකැටිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය, ඉඩමේ ස්වභාවය හා වාර්ෂික ආදායම කොපමණද;

(iii) එම ඉඩම්වල අයිතිය නිත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(iv) ඒ කවර කාර්යයක් සඳහා කවර පදනමකින්ද;

(v) එම පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය, කාල සීමාව හා කොමිෂන් සභාවට වාර්ෂිකව ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නිත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම්, ඉඩම් ප්‍රමාණය සහ ඒ කවදා සිටද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා 2009.08.01 දිනට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම්, ලිපිනයන් සහ ඉඩම් ප්‍රමාණයන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0181/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) අඟුණුකොලපැලැස්ස ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය, ඉඩමේ ස්වභාවය හා වාර්ෂික ආදායම කොපමණද;

(iii) එම ඉඩම්වල අයිතිය නිත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(iv) ඒ කවර කාර්යයක් සඳහා කවර පදනමකින්ද;

(v) එම පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය, කාල සීමාව හා කොමිෂන් සභාවට වාර්ෂිකව ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නිත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම්, ඉඩම් ප්‍රමාණය සහ ඒ කවදා සිටද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා 2009.08.01 දිනට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අත්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අත්සතු කළ අයගේ නම, ලිපිනය සහ ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0182/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය, ඉඩමේ ස්වභාවය හා වාර්ෂික ආදායම කොපමණද;

(iii) එම ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(iv) ඒ කවර කාර්යයක් සඳහා කවර පදනමකින්ද;

(v) එම පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය, කාල සීමාව හා කොමිෂන් සභාවට වාර්ෂිකව ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නීත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම්, ඉඩම් ප්‍රමාණය සහ ඒ කවදා සිටද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා 2009.08.01 දිනට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අත්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අත්සතු කළ අයගේ නම, ලිපිනය සහ ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2011 ජූලි මස 08 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0587/'10

ගරු රවී කරුණානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ලොව පුරා ක්‍රියාත්මක ශ්‍රී ලංකා තානාපති කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) අදාළ රට තුළ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයක් පිහිටා තිබීමට හේතුව කවරේද;

(iii) එසේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයක් පිහිටා ඇති එක් එක් රට තුළ වෙසෙන ශ්‍රී ලාංකිකයින් සංඛ්‍යාව කවරේද;

(iv) යම් රටක ශ්‍රී ලංකා තානාපති කාර්යාලයක් නොමැති නම්, එම රටේ වෙසෙන ශ්‍රී ලාංකිකයින්ගේ අවශ්‍යතා සම්බන්ධයෙන් කටයුතු කරන තානාපති කාර්යාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එක් එක් තානාපති කාර්යාලයේ මුළු කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව සහ ඒවායේ සේවකයින් හා කාර්යාල පවත්වාගෙන යාම සඳහා වන වාර්ෂික පිරිවැය කවරේද;

(ii) තානාපති කාර්යාලවල ඇති දේපල සහ තානාපති කාර්යාලය පිහිටි නිවස ශ්‍රී ලංකාවට අයත්ද;

(iii) එසේ නම්, ඒ වෙනුවෙන් ගෙවූ මුදල හා එම ගෙවීම සිදු කරන ලද දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0842/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010 එක්සත් ජාතීන්ගේ සමුළුව සඳහා සහභාගි වූ ජනාධිපතිවරයා ඇතුළු කණ්ඩායමේ සිටි සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමුළුව සඳහා එක් රටකට ලැබෙන නිල අවසර පත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iii) එම කණ්ඩායම නවාතැන් ගත් ස්ථානයේ නම කුමක්ද;

(iv) එම සංචාරය වෙනුවෙන් වියදම් වූ මුළු මුදල කොපමණද;

(v) එම වියදම දරනු ලබන අය කවුරුන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම සමුළුවට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික අනෙකුත් රටවල්වලින් ඉදිරිපත් කළ නියෝජිත සංඛ්‍යාව එක් එක් රට අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0766/'10

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කේ. පී. නමින් හඳුන්වන එල්. ටී. ටී. ඊ. සංවිධානයේ මුදල් සැපයුම්කරු විසින් 2010 අගෝස්තු මස 14 වැනි දින මාධ්‍යවේදියකු සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡාවකදී, යාපනයේ නීරාවලි ප්‍රදේශයේ පිහිටි රාජ්‍ය බැංකුවක් මංකොල්ලකෑමට තමා සම්බන්ධවූ බව අනාවරණය කර තිබේද;

(ii) එසේ නම්, මහජන මුදල් මංකොල්ලකෑමේ චෝදනාව යටතේ කේ. පී. යන අයට එරෙහිව රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) මහජන මුදල් මංකොල්ලකෑම යන චෝදනාව යටතේ කේ. පී. යන අයට එරෙහිව චෝදනා ගොනුකිරීමට රජය අදහස් නොකරන්නේ නම්, ඒ හා සමාන චෝදනා යටතේ අධිචෝදනා ගොනු කරනු ලැබ ඇති සියලුම පුද්ගලයින් නිදහස් කිරීම හෝ ඔවුන්ට සමාව ලබා දීම සිදු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0982/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, පිටබැද්දර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත්, ඇතාමල ඇල්ල කේන්ද්‍ර කරගනිමින් මේ වන විට විදුලිබලාගාර ව්‍යාපෘතියක් ආරම්භකර තිබේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය ඉදිකිරීමට අදාළව මධ්‍යම පරිසර අධිකාරිය විසින් ලබාදුන් වාර්තාව ඉදිරිපත් කරන්නේද;

(iii) එම ව්‍යාපෘතිය අයත් වන ආයතනය කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා වෙන්කර ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) පරිසර හානි හා ව්‍යාපෘති යෝජනා උල්ලංඝනය වීම හේතුවෙන් මධ්‍යම පරිසර අධිකාරිය විසින් මෙම ඉදිකිරීම නවත්වන ලෙස දැනුම් දී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ආර්ථිකමය වටිනාකමක් බලාපොරොත්තුවෙන් දිය ඇළි ආශ්‍රිතව සිදු කර ඇති විදුලි ව්‍යාපෘති හේතුවෙන් දිය ඇලි ගණනාවක් අපට අහිමි වී ඇති බවත්;

(ii) ඇතා මල ඇල්ල දිය ඇල්ලද එවැනි ඉරණමකට ගොදුරු විය හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0767/'10

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය, ලංකා ධීවර සංස්ථාව සහ මාර්ග සංවර්ධන අධිකාරිය යන ආයතනවල ගිණුම් අනුමත කළ නොහැකි බව විගණකාධිපතිවරයා විසින් 2007 වර්ෂය සඳහා වූ සිය වාර්තාවේ සඳහන් කර ඇති බවත්;

(ii) විගණකාධිපතිවරයා විසින් එකී ආයතනවල ගිණුම් පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් වගකීම භාර ගත නොහැකි බව සඳහන් වාර්තාවක් ලබා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) විගණකාධිපතිවරයා විසින් අනාවරණය කරනු ලැබූ ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(ii) ඉහත සඳහන් ලෙස වගකීම භාර ගත නොහැකි බව සඳහන් වාර්තාවක් ඉදිරිපත් කිරීම නිසා විගණකාධිපතිවරයා ඉවත්කර ඒ වෙනුවට වෙන අයෙක් පත් කිරීමට කටයුතු කරනු ලබන්නේද;

(iii) විගණකාධිපතිවරයා විසින් සිය 2007 වර්ෂය සඳහා වූ වාර්තාවේ සහ ඉන් පසුව වගකීම භාර ගත නොහැකි බව පවසමින් ඉදිරිපත් කරන ලද වාර්තා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සේවය කරන කාර්ය මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත සඳහන් දෙපාර්තමේන්තුව අවශ්‍ය ප්‍රමාණයට කාර්ය මණ්ඩලය නොමැති, වැඩ අධික සහ අඩු වැටුප් ගෙවන ආයතනයක්ද;

(iii) එසේ නම්, එම තත්ත්වය නිවැරදි කිරීම පිණිස ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0983/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ සිටින හදිසි මරණ පරීක්ෂකවරුන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ සේවය ස්ථිර කර තිබේද;

(iii) එක් අයකුට ගෙවනු ලබන වැටුප හෝ දීමනාව කොපමණද;

(iv) එම තනතුර සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(v) ඔවුන් පත්කරනු ලබන බලධාරියා කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ සිටින හදිසි මරණ පරීක්ෂකවරු සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් සහ එක් එක් මරණ පරීක්ෂකවරයාගේ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 7/'10

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය බැංකු වලින් ලබා ගත් ණය පැහැරහරින්නන්ගේ නම් ප්‍රසිද්ධියට පත් කිරීම,— රාජ්‍ය බැංකුවලින් රුපියල් මිලියන 100 කට අධික ණය ලබා ගෙන ආපසු ගෙවීම පැහැරහරින්නන්ගේ නම් ප්‍රසිද්ධියට පත් කිරීම සඳහා නීති සම්පාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 8/'10

ගරු රවී කරුණානායක මහතා,— පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා ක්‍රියාත්මක කිරීම,— පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා ඵලදායී ක්‍රමයක් වන අයුරින්, ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු වසරක් තුල විවාදයට භාජනය කළ යුතු බවත්, ඒවා සභා සම්මත වුවහොත්, හය මාසයක් තුළ අමාත්‍ය මණ්ඩලය විසින් ද අනුමත කළ යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 9/'10

ගරු රවී කරුණානායක මහතා,— පාර්ලිමේන්තුව තුළ ජාතික ගීය වාදනය කිරීම,— දිවයින තුළ ජාතික මමත්වයක් වර්ධනය කිරීමට හැකිවනු වස් පාර්ලිමේන්තුවේ රැස්වීම ආරම්භ කිරීමට හා අවසාන කිරීමට පෙරාතුව පාර්ලිමේන්තුව තුළ ජාතික ගීය වාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 10/'10

ගරු රවී කරුණානායක මහතා,— බලගතු ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ගොඩනැගීම,— ආණ්ඩුවේ ලිපිලේඛනාදියෙහි යම් කෙනෙකුගේ ජාතිය හා ආගම සඳහන් කිරීම අවශ්‍ය කරුණක් වීම බලගතු ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ගොඩනැගීමට බාධාවක් හා අවහිරයක් වී ඇති බැවින් එම අවශ්‍යතාවය ඉවත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 11/'10

ගරු රවී කරුණානායක මහතා,— වාණිජ අරමුණු සඳහා ආගමික නායකයින්ගේ රූප භාවිතා කිරීම වැළැක්වීම,— සියලුම ආගම්වලට සමානව ගරු කළ යුතු අතර කිසිදු වෙළෙඳ දැන්වීමක හෝ වෙනත් ආගමික නොවන භාණ්ඩයක බුදුරජාණන් වහන්සේගේ, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ, ශිව දෙවියන්ගේ සහ මහම්මත් නබිතුමන්ගේ රූප ඇතුලත් නොකළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 12/'10

ගරු රවී කරුණානායක මහතා,— අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට නව නීති සකස් කිරීම,— සියලු දෙනාටම සමාන සාධාරණත්වයක් සහතික කරනු වස් ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදයක් සහ උද්දීප්තිමත් නිදහස් මාධ්‍යයක් පවත්වාගෙන යාම සඳහා අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට නව නීති සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 13/'10

ගරු රවී කරුණානායක මහතා,— මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වාදීම,— දිළිඳු ජනතාවගේ මූලික මිනිස් අයිතිවාසිකම් කඩවීම, රාජ්‍ය ප්‍රතිපත්ති වල අඩංගු දේ හෝ ඒවායේ බලපෑම, පොදු කටයුතු ඉටු කිරීමට නාගරික අධිකාරයන්ට බලපෑම් කිරීම, ආගමික අයිතිවාසිකම් හෝ අනෙකුත් මූලික අයිතිවාසිකම් කඩවීම සහ අධික මහජන ණය හා පුරවැසියන් අතිරේක වගකීම් වලට යොමු කැරෙන දූෂණය යන කරුණු සම්බන්ධයෙන් මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/'10

ගරු රවී කරුණානායක මහතා,— දේශපාලන පක්ෂ විසින් මැතිවරණ කොමිෂන් සභාවට මූල්‍ය විගණන වාර්තාවක් ඉදිරිපත් කිරීම,— සියලුම පිළිගත් දේශපාලන පක්ෂ විසින් උපයාගත් ආදායම් හා දැරූ වියදම් විගණනයට භාජනය කළ යුතු හා මැතිවරණ කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/'10

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය නිලධාරීන්ට දඬුවම් පැමිණවීම,— රජයේ උසස් නිලධරයන් තම ස්වාධීන නිලය දේශපාලනීකරණය කරන්නේ නම් හා අයථා ලෙස යොදා ගන්නේ නම්, එයින් වැරදිකරුවන් බව ඔප්පු වූ වහාම ඔවුන්ට දඬුවම් පැමිණවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/'10

ගරු රවී කරුණානායක මහතා,— විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව දීර්ඝ කිරීම,— රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 දක්වා වැඩි කළ යුතු යැයිද, ව්‍යවස්ථාදායකය විසින් නිර්දේශ කරනු ලැබුවහොත් විශේෂ කුසලතා ඇති නිලධාරීන් සඳහා එය අවුරුදු 70 දක්වා දීර්ඝ කළ හැකි යැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/'10

ගරු රවී කරුණානායක මහතා,— අධ්‍යාපනය ආරක්ෂා කිරීම සඳහා තත්ත්ව ආරක්ෂණ සභාවක් ස්ථාපිත කිරීම,— වගකීමකින් තොරව විශ්වවිද්‍යාල නාමයන් භාවිත කරමින් ශ්‍රී ලංකාව තුළ විශාල වශයෙන් අධ්‍යාපනික ආයතන බිහිවෙමින් පවතින නිසා, අධ්‍යාපනය අනාගත පරම්පරාව සඳහා ආරක්ෂා කර දීම උදෙසා "තත්ත්ව ආරක්ෂණ සභාවක්" නීතිමය වශයෙන් වහා ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/'10

ගරු රවී කරුණානායක මහතා,— "විශේෂ නඩු පවරන නිලධාරී" නමැති තනතුරක් ඇති කිරීම,— රාජ්‍ය සේවය දේශපාලන බලපෑම් වලින් තොර බවට සහතික කරනු වස්, ආයතනවල ගුණාත්මකභාවයට බලපාන ලෙස සිදු කළ අයථා පරිහරණයන්, දූෂණයන් හෝ අකාර්යක්ෂමතාවයන් පිළිබඳ සිද්ධීන්, ස්වාධීන කොමිසම්, රාජ්‍ය ගිණුම් කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මගින් වාර්තා කළ වහාම ඒ සම්බන්ධ පැමිණිලි මෙහෙයවන, පාර්ලිමේන්තුවට සෘජුවම වාර්තා කරනු ලබන තනතුරක්, "විශේෂ නඩු පවරන නිලධාරී" නමින් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 19/'10

ගරු රවී කරුණානායක මහතා,— අයවැය සම්මත කිරීමට පෙර පූර්ව අයවැය විවාදයක් පැවැත්වීම,—ඉන්දියාව හා එක්සත් රාජධානිය මෙන් අවසාන හා පූර්ණ අයවැය සම්මත කිරීමට මාස තුනකට ප්‍රථම, අයවැය ඇස්තමේන්තුවල අහිතකර හෝ අවාසිදායක බලපෑම් ඇතොත් ඒවා අවම කිරීමට සහ නිවැරදි කිරීමට හැකි වන පරිදි පූර්ව අයවැය විවාදයක් පැවැත්විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/'10

ගරු රවී කරුණානායක මහතා,— උද්ධමනයට ගැලපෙන සේ සේවා නියුක්තිකයන්ට 1%ක දීමනාවක් ගෙවීම,— රාජ්‍ය ආයතන විසින් පරිපාලනය කරනු ලබන සේවා නියුක්තිකයන්ගේ අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල ගෙවීමේ දී එක් එක් වර්ෂයේ උද්ධමනය ප්‍රමාණයට වඩා 1%ක දීමනාවක් සේවා නියුක්තිකයන්ට ලබා දීමට සහතික විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/'10

ගරු රවී කරුණානායක මහතා,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට නොමිලේ ගමන් පහසුකම් සැලසීම,— සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට පොදු ගමනාගමන සේවාවන්වල නොමිලේ ගමන් පහසුකම් සලසා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/'10

ගරු රවී කරුණානායක මහතා,— අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටුවීම,— සාමය කඩවීම වැනි ජාතික ප්‍රශ්නයක් ඇති ශ්‍රී ලංකාව බහු ජාතික හා බහු ආගමික රටක් වන හෙයින්, ශ්‍රී ලංකාව තුළ, කලාපය තුළ හා සමස්ථ වශයෙන් ලෝකයේම එවැනි ප්‍රශ්න විසඳීම සඳහා බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු හා ඉස්ලාම් ආගම්වල ශක්තිය ප්‍රයෝජනයට ගනිමින් අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 23/'10

ගරු රවී කරුණානායක මහතා,— විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව ලබා දීම,— මෙතෙක් විශ්‍රාමික පාරිතෝෂික මුදල් ලබා නොදුන් විශ්‍රාමිකයින්ට එම විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 24/'10

ගරු රවී කරුණානායක මහතා,— ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත් කිරීම,— ක්‍රමවත් ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් නිර්මාණය කිරීම සඳහා දේශපාලනඥයන්ගෙන් හා විෂය බද්ධ වෘත්තීයවේදීන්ගෙන් සමන්විත ආණ්ඩු මාරුවීම් අනුව වෙනස් නොවන නිශ්චිත බලයක් සහිතවූත් ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත්කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 25/'10

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියා නියුක්තිකයන්ගේ ගැටලු නිරාකරණය කිරීම සඳහා නීතිමය බලතල සහිත ඒකකයක් පිහිටුවීම,— විදේශ රැකියාවන්හි නියුක්ත වූවන්ට සිදුවන පහරදීම්, පැහැරගෙන යෑම්, ස්ත්‍රී දූෂණ, ලිංගික අපචාරයෙහි යෙදවීම්, මිනීමැරීම් හා විදේශගත වීමේදී සිදුවන මුදල් වංචා කිරීම් හා විදේශගත වී අනාථ වූවන් නැවත ගෙන්වා ගැනීම හා ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳ සොයා බැලිය හැකි නීතිමය බලතල ඇති ඒකකයක් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 26/'10

ගරු රවී කරුණානායක මහතා,— නව නිපැයුම්කරුවන් ලෝකයට හඳුන්වා දීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් සකස් කිරීම,— නව නිපැයුම්කරුවන් සහ විවිධ දක්ෂතා ඇති පුරවැසියන් ලෝකයට හඳුන්වාදීම සඳහා ද ඔවුන් සතු දක්ෂතා හා එකී නිර්මාණ දියුණු කර ගැනීම සඳහා ද ජාතික වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 27/'10

ගරු රවී කරුණානායක මහතා,— දේශීය අමු ද්‍රව්‍ය යොදා ගන්නා කර්මාන්තකරුවන්ට බදු සහන ලබා දීම,— සම්පූර්ණයෙන් ජාත්‍යන්තර වෙළෙඳපොල සඳහා ඉලක්ක කර ගනිමින් 75% කට වඩා දේශීය අමුද්‍රව්‍ය යොදා ගනිමින් භාණ්ඩ නිපදවන දේශීය කර්මාන්තකරුවන්ට අවුරුදු 02ක බදු සහන කාලයක් ලබා යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 28/'10

ගරු රවී කරුණානායක මහතා,— වතුකර ජනතාවට පුරවැසිකම් ලබාදීම,— වතුකරයේ ශ්‍රී ලංකා පුරවැසිකම නොමැති සියලු ජන කොට්ඨාසවලට ඔවුන්ගේ කැමැත්ත මත පුරවැසිභාවය ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 29/'10

ගරු රවී කරුණානායක මහතා,— දිවයිනේ ප්‍රාථමික පාසල් දරුවන්ට නොමිලේ කිරි වීදුරුවක් ලබා දීම,— දිවයිනේ සියලු ප්‍රාථමික පාසල් දරුවන්ට උදෑසන නොමිලයේ කිරි වීදුරුවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 30/'10

ගරු රවී කරුණානායක මහතා,— සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දීම,— සේවක අර්ථ සාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දිය හැකි වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 31/'10

ගරු රවී කරුණානායක මහතා,— පාසල් ළමුන් සඳහා නිදහස් වාර ගමන් ප්‍රවේශ පත්‍ර ලබා දීම,— පාසල් ළමුන්ට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ බස් රථවල ගමන් කිරීම සඳහා නිදහස් වාර ප්‍රවේශපත් ක්‍රමයක් හඳුන්වාදීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 32/'10

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා පාසල් ඉදිකිරීම හා ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීම,— දිගුකාලීන ඉලක්කයක් සහිත ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් හා වැඩ පිළිවෙළක් සකස් කිරීම උදෙසා මූලික වශයෙන් සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි ක්‍රීඩාගාර, පිට්ටනි, උපකරණ හා ක්‍රීඩා උපදේශකයන්ගෙන් සමන්විත උසස් ගණයේ ක්‍රීඩා පාසල් ඉදි කිරීමටත් ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීමටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 33/'10

ගරු රවී කරුණානායක මහතා,— ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් පිහිටුවීම,— ගුරුවරුන්ට සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම සඳහා ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් ස්ථාපිත කිරීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 42/'10

ගරු අජිත් කුමාර මහතා,— 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත සංශෝධනය කිරීම,— ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කටයුතුවල නියැලෙන ගොවීන් සතු ඉඩම්වල අයිතිය විවිධ හිමිකම් යටතේ පවතින අතර ඉන් බොහෝ දෙනෙක් අඳ ගොවියන් වන හෙයින් ද, ඉහත පනත මගින් අඳ ගොවි ක්‍රමය අහෝසි කිරීමේ හේතුවෙන් අඳ ගොවීන් ගොවි බිම් වලින් නෙරපා දමා ඇති අතර නීතිමය රැකවරණයක් නොමැතිකමින් විවිධ ගැටුම්කාරී තත්ත්වයන් නිර්මාණය වෙමින් පවතින හෙයින් ද, අඳ ගොවීන්ට වූ එම අසාධාරණය දුරැලීම සඳහා 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත සංශෝධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 43/'10

ගරු අජිත් කුමාර මහතා,— උස්සන්ගොඩ කඳුවැටිය පිහිටි භූමිය සංරක්ෂණය කිරීම,— ප්‍රාග් ඓතිහාසික යුගයේ මධ්‍යම පුරාශිලා යුගයට අයත් යැයි හඳුනාගෙන ඇති දකුණු පළාතේ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මුහුදු වෙරළ තීරයේ පිහිටා ඇති දකුණේ හෝර්ටන් තැන්න නමින් ප්‍රකට උස්සන්ගොඩ කඳුවැටිය පිහිටා ඇති භූමිය, ශ්‍රී ලංකාවේ විවෘත ජනාවාසයකින් අවුරුදු විසි අටදහසක් පැරණි ජ්‍යාමිතික ආයුධ හා පාෂාණ සොයාගත් භූමියක් ලෙස ද, සාගර හා ගොඩබිම් ජෛව විවිධත්වය අතින් ඉතා පොහොසත් භූමියක් ලෙස ද, කදිම කැස්බෑ වාසස්ථානයක් ලෙස ද, සුනාමි රළ පහරින් ජනතාව ආරක්ෂා කළ පවුරක් ලෙස ද, අතිශය වටිනාකමක් උරුම කරගෙන ඇති හෙයින් එම භූමිය තුළ ආරම්භ කිරීමට යෝජිත ව්‍යාපෘති නවතා දමා වහාම සංරක්ෂණය කළ යුතු පරිසර පද්ධතියක් ලෙස ප්‍රකාශයට පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 44/'10

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය තොරතුරු නිදහස්ව ලබා ගැනීම සඳහා නීති සම්පාදනය කිරීම,— රජයේ විනිවිදභාවය පවත්වා ගැනීම සඳහා ද, මහජනතාවට සියලු රාජ්‍ය තොරතුරු නිදහස්ව ලබා ගැනීමේ අයිතිය උදෙසා ද පාර්ලිමේන්තුව තුළ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.45/'10

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලාංකිකයින්ට වඩා යහපත් සෞඛ්‍ය අවස්ථාවන් සලසා දීම,— ජනතාවගෙන් විශාල පිරිසකට හදවත් සැත්කම් කිරීම අවශ්‍යව ඇති හෙයින්, ශ්‍රී ලාංකිකයන්ට වඩා හොඳ සෞඛ්‍ය අවස්ථාවන් සලසා දිය යුතු යැයි ද, ඒ සඳහා පෞද්ගලික අංශයේ සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදල හෝ සේවක භාරකාර අරමුදල හරහා නොමිලයේ පහසුකම් සලසා දිය යුතුයැයි ද, රජයේ සේවකයන් හෝ සේවා වියුක්තිකයන් සඳහා සම්පූර්ණ වියදම රජය විසින් ජනාධිපති අරමුදල හරහා සැපයිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.46/'10

ගරු රවී කරුණානායක මහතා,— ලෝක පරිසරය ආරක්ෂා කිරීම,— ශ්‍රී ලංකාව, ලෝක පරිසරය ආරක්ෂා කිරීම කෙරෙහි දැඩි අවධානය යොමු කළ යුතු අතරම ගෝලීය උණුසුම වැළැක්වීමට විශේෂයෙන් පියවර ගතයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.47/'10

ගරු රවී කරුණානායක මහතා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු විකාශනය කිරීම,— රූපවාහිනිය හෝ අන්තර්ජාලය හරහා පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු සජීවිව හෝ පරීක්ෂිතව විකාශනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.48/'10

ගරු රවී කරුණානායක මහතා,— එතෙර ජීවත් වන ශ්‍රී ලාංකිකයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමට අවසර දීම,— එතෙර ජීවත්වන ශ්‍රී ලාංකිකයන්ට ඉදිරි මැතිවරණ සඳහා ඡන්දය ප්‍රකාශ කිරීමට අවසර දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.49/'10

ගරු රවී කරුණානායක මහතා,— විද්‍යුත් ඡන්ද ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් හඳුන්වාදීම,— යල්පැන ගිය වර්තමාන ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමය වෙනුවට විද්‍යුත් ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.50/'10

ගරු අජිත් කුමාර මහතා,— ශ්‍රී ලංකාවේ වටිනා ස්වභාවික සම්පත් හා ඒ ආශ්‍රිත ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහා විධිමත් විද්‍යාත්මක සැලැස්මක් ක්‍රියාත්මක කිරීම,— ශ්‍රී ලංකාවේ පමණක් නොව ලෝකයේම වටිනා ස්වාභාවික සම්පත් ලෙස සැලකෙන සිංහරාජ වනාන්තරය, කන්නෙලිය රක්ෂිත වනාන්තරය, රුමස්සල කන්ද, කොග්ගල ඔය දූපත් හා කඩොලාන පද්ධතිය, රම්සා තෙත් බිමක් වන මාදු ගඟ හා ඒ ආශ්‍රිත ප්‍රදේශ ආරක්ෂා කිරීමටත්, ප්‍රවර්ධනය කිරීමටත් විධිමත් විද්‍යාත්මක සැලැස්මක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.51/'10

ගරු අජිත් කුමාර මහතා,— ගාලු කොටුව හා ඒ ආශ්‍රිත ඓතිහාසික හා පුරා විද්‍යාත්මක උරුමයන් ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම හා නිසි ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කිරීම,— සංචාරක කර්මාන්තයේ ඉතා වැදගත් මධ්‍යස්ථානයක් වූ ද, ඓතිහාසික හා පුරා විද්‍යාත්මක වටිනාකමකින් යුතු වූ ද, ලෝක උරුමයක් ලෙස සැලකෙන ගාලු කොටුපවුර, ගාලු කොටුව ඇතුළත හා ගාලු කොටුව ආශ්‍රිතව ඇති ඓතිහාසික හා පුරා විද්‍යාත්මක උරුමයන් ආරක්ෂා කිරීමටත්, ප්‍රවර්ධනය කිරීමටත්, ඒ හා සම්බන්ධ රාජ්‍ය ආයතන හා ජන සහභාගීත්වය ඇතිව විධිමත් සැලැස්මක් ක්‍රියාත්මක කරමින් අප රටට මෙම ඓතිහාසික උරුමයේ නිසි ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.54/'10

ගරු තිලංග සුමතිපාල මහතා,— වෛද්‍ය ක්ෂේත්‍රයේ වෘත්තීමය වටිනාකම සුරැකීම,—දේශීය හා ජාත්‍යන්තර වෛද්‍ය ක්‍රමය තුළ වෘත්තීමය සුදුසුකම් හා අත්දැකීම නොමැති වෛද්‍යවරුන් හා වෛද්‍යවරියන් ප්‍රතිකාර කිරීමෙහි යෙදී සිටීම තුළින් සාමාන්‍ය රෝගී ජනතාවට විශාල ගැටලු වලට මුහුණ පෑමට සිදුවීමෙන් අසරණ තත්ත්වයකට පත්ව ඇති හෙයින් ද, ඒ තුළින් වෛද්‍ය ක්ෂේත්‍රය තුළ සිටින්නා වූ සුදුසුකම් ඇති වෛද්‍ය වෘත්තිකයන් සමාජය තුළ අවමානයට පත්ව ඇති හෙයින්ද, වෛද්‍ය ක්ෂේත්‍රයේ වෘත්තීමය වටිනාකම සුරැකීමට, ක්‍රමවත්ව හා විධිමත්ව නීත්‍යානුකූලව ක්‍රියාත්මක විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.55/'10

ගරු තිලංග සුමතිපාල මහතා,— මාධ්‍ය නිදහස හා තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කිරීම,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළම තොරතුරු දැනගැනීමේ හා ප්‍රකාශ කිරීමේ අයිතිය තහවුරු කර ඇති හෙයින් ද, තාක්ෂණය දියුණු වෙමින් පවතින ලෝකයක සත්‍ය සැඟවීමට හෝ වසන් කිරීමට අවස්ථාවක් නොමැති හෙයින් ද, ප්‍රජාතාන්ත්‍රික රටක සියලු පුරවැසියන්ට නිදහස් මාධ්‍ය තුළින් දැනුම හා අවබෝධය ලබාගැනීමේ අවකාශය ලබාදිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.56/'10

ගරු තිලංග සුමතිපාල මහතා,—ක්‍රීඩාව තුළින් නිරෝගීමත් සමාජයක් නිර්මාණය කිරීම,— ළමා අවධියේදීම දරුවන් ක්‍රීඩාවට යොමු කිරීම තුළින් නිරෝගීමත් සමාජයක් බිහිකිරීමටත්, සහජ කුසලතා ඇති දරුවන් ජාත්‍යන්තර තලයට යොමු කිරීමටත්, ලොව සුපතල ක්‍රීඩකයින් බිහි කර රටට කීර්තියක් ලබා ගැනීමටත් හැකිවන පරිදි ජාති භේදයෙන් පන්ති භේදයෙන් තොරවූ සාධාරණ ක්‍රම වේදයක් රාජ්‍ය මට්ටමින් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.57/'10

ගරු රවී කරුණානායක මහතා,— ඡන්ද හිමි නාම ලේඛනය නිරතුරුව යාවත්කාලීන කිරීම,— ඡන්ද හිමි නාම ලේඛනය මුළු වර්ෂයෙන්ම දින තිහක කාලයක් සඳහා පමණක් යාවත්කාලීන වන ලයිස්තුවක් නොව නිරතුරුවම යාවත් කාලීන වන විවෘත ලැයිස්තුවක් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.59/'10

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියාවල නියුතු අය සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබාදීම, —විදේශ ගතවී ඉතා අපහසුවෙන් උපයාගත් ධනය ශ්‍රී ලංකාවේ ධන සම්පත්තිය වැඩිකිරීම සඳහා එවන විදේශ රැකියාවල නියුතු අය ඇගයීම පිණිස විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබා දීම සඳහා පියවර ගතයුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.60/'10

ගරු රවී කරුණානායක මහතා,— 2009 මැයි 19 දිනට පෙර සේවයේ සිටි සන්නද්ධ සේනාවන් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම,—පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වසර පහක සේවා කාලය සම්පූර්ණවූ පසු විශ්‍රාම වැටුප් ලැබීමට සුදුසුකම් ලබන බැවින් සන්නද්ධ සේනාවන්වල අවුරුදු 22 ක කාලය සම්පූර්ණ නොකළද 2009 වර්ෂයේ මැයි 19 වන දිනට පෙර ක්‍රියාකාරී සේවයේ යෙදී සිටි යුධ සෙබළුන්ට ද විශ්‍රාම වැටුප් ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.62/'10

ගරු රවී කරුණානායක මහතා,— දුබල හා එහා මෙහා යා නොහැකි පුද්ගලයන් සඳහා විශේෂ සැලසුම් හඳුන්වාදීම,— නීතියේ සඳහන් වන පරිදි දුබල හා එහා මෙහා යා නොහැකි පුද්ගලයන්ගේ පහසුව තහවුරු කිරීමට හා ඔවුන් සතු ඵලදායීතාව වර්ධනය කිරීම සඳහාත් ඔවුන් අනවශ්‍ය ලෙස අනුන් මත යැපීම අවම කිරීම සඳහාත් සියලු නව රජයේ ගොඩනැගිලිවල විශේෂිත සැලසුම් ක්‍රමයක් ඇතිකළ යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.63/'10

ගරු රවී කරුණානායක මහතා, — ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය තහවුරු කිරීම,— ලියාපදිංචිවූවද ඡන්දය ප්‍රකාශකිරීමට අවස්ථාව නොලැබුනු ඡන්දදායකයන් බොහෝ සංඛ්‍යාවක් සිටින බැවින් වයස අවුරුදු 18 ට වැඩි සියලුම පුද්ගලයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ලබා දිය යුතු බව සහ ඡන්ද හිමි නාමලේඛනයේ නම සඳහන්වූ නමුත් ඡන්දය ප්‍රකාශ නොකරන පුද්ගලයන්ගෙන් දඩ මුදලක් අයකළ යුතුබව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.64/'10

ගරු රවී කරුණානායක මහතා,— දූෂණයෙන් තොර ලෝකයක් තහවුරු කිරීම— දූෂණය මුලින් උපුටා දැමීම සඳහා ලෝකයේ පාර්ලිමේන්තු සංවිධාන සමඟ එක්වී ශ්‍රී ලාංකික පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කටයුතු කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.65/'10

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— කාදි අධිකරණ පද්ධතියට නිසි ස්ථානය ලබා දීම,— 1929 දරණ මුස්ලිම් විවාහ හා දික්කසාද ආඥාපනත යටතේ කාදි අධිකරණ පද්ධතිය ශ්‍රී ලංකාවේ ස්ථාපිත කළ අතර ඉන් පසුව 1951 දී මුස්ලිම් විවාහ හා දික්කසාද පනත යටතේ සංශෝධනය කරන ලද එම ආඥාපනත මුස්ලිම් පවුල්වල පැනනගින ගැටලු පිළිබඳ සියළුම කාරණා සම්බන්ධ තීරණයන් ගැනීමට කාදි විනිශ්චකාරවරුන්ගේ බල තල වැඩිකළ යුතු අතර එම පද්ධතියේ ගෞරවයට නිසි තැන ලබා දෙමින් නඩු විභාග වාර නිසි පරිදි පැවැත්වීමට කාදි අධිකරණ පද්ධතියේ තත්ත්වය උසස් කළ යුතු බව සහ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කාදි විනිශ්චකාරවරුන් පත්කරන බැවින් සෙසු අධිකරණ නිලධාරීන් හට හිමි වන ගරුත්වය හා පිළිගත් වැටුප් තලය මත ස්ථාන ගත කළ යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 69/'10

ගරු රවී කරුණානායක මහතා,— මුළාවට ලක්වූ තැන්පත්කරුවන්ට තම මුදල් නැවත ගෙවීම,— ව්‍යාජ මූල්‍ය ආයතනවල තම මුදල් තැන්පත්කර එමඟින් මුළාවට ලක්වූ බොහෝ දෙනෙක් සිටින බැවින් හා පසුගිය 2009/2010 මැතිවරණ ව්‍යාපාරයේදී මෙම රජය විසින් තැන්පත්කරුවන් සහ මූල්‍ය ආයතනවලට ඔවුන්ගේ හිඟ මුදල් නැවත ගෙවීමට පොරොන්දුවී ඇති බැවින්, මහ බැංකුව මෙම ආයතනවල භාරකරු හෙයින් වඩා කාර්යක්ෂම ලෙස කටයුතු කළ යුතු බවත්, තැන්පත්කරුවන්ට තම හිඟ මුදල ලබා දීමට රජය ඉදිරිපත් විය යුතු බවත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 71/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශීය ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා සාමවිනිසුරු පත්වීම් ලබා දීම,— දේශීය ආයුර්වේද වෛද්‍යවරුන් මුදල් සහ වරප්‍රසාද අපේක්ෂාවෙන් තොරව ඔවුන්ගෙන් සමාජයට ඉටුවිය යුතු සමාජ වගකීමක් ලෙස සලකා විශේෂයෙන් ග්‍රාමීය ජනතාවට විශාල සේවාවක් ඉටු කරනු ලබන බැවින් එම සේවාවට ගරු කිරීමක් ලෙස ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී ඇති සියළුම දෙනාට සාමවිනිසුරු පදවි ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 72/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සාමවිනිසුරු තනතුරු ලබා දීමේ දී විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම,— මුළු මහත් සමාජයම පොදුවේ පිළිගනු ලබන සහ සමාජයට විශාල සේවාවක් සපයනු ලබන තනතුරක් වන සාමවිනිසුරු තනතුරු ලබා දීමේදී ඒ සඳහා සුදුසු නිර්නායක පදනම් කොට ගෙන එම තනතුරු ලබා නොදීම නිසා එම තනතුරෙහි ගෞරවය හා පොදු පිළිගැනීම ක්‍රමයෙන් හීන වන බැවින් ඒ සඳහා පොදුවේ පිළිගත හැකි නිර්නායක පදනම් කර ගන්නා වූ ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.74/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සුනාමි ඛේදවාචකයෙන් ඇතිවූ ගැටලු විසඳීම,— සුනාමි ඛේදවාචකය හේතුවෙන් කුමන හෝ ආකාරයේ ගැටලුවකට මුහුණ දී මේ වන තෙක් නොවිසඳී පවතින ගැටලු තිබේ නම්, ප්‍රාදේශීය ලේකම්, දිස්ත්‍රික් ලේකම් කොට්ඨාස මට්ටමින් සොයා බලා ඔවුන් මුහුණ දී ඇති හා දැනටත් මුහුණ දෙනු ලබන ගැටලු අවම කිරීම සඳහා කාර්යක්ෂම වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.75/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ගෘහස්ථ ශ්‍රමිකයින් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ විවිධ රැකියා උත්පාදන ක්ෂේත්‍ර තුළ විවිධ නිෂ්පාදන කටයුතු කරන දසලක්ෂයකට ආසන්න ගෘහස්ථ ශ්‍රමිකයින් සඳහා දේශපාලන බල අධිකාරිය ඒ සඳහා සබැඳි සියලු ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයින්, උගතුන් හා බුද්ධිමතුන්ගෙන් මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි ද සහාය ලබා ගනිමින් විධිමත් ජාතික ප්‍රතිපත්තියක් සකස් කොට එය කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.76/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—වී වගා කළ නොහැකි කුඹුරු ඉඩම් ඵලදායි කටයුතු සඳහා යොදා ගැනීම,—කුඹුරු ඉඩම් ගොඩකිරීමේ නීතිය උල්ලංඝනය නොවන පරිදි, විධිමත් අධ්‍යයනයකින් හඳුනා ගැනීමෙන් පසු කිසිසේත්ම වී වගා කළ නොහැකි කුඹුරු ඉඩම්වල ඵලදායි කෘෂි නිෂ්පාදන පමණක් වගා කිරීමටත් ,ඉදිකිරීම් කටයුතු සඳහා කිසිසේත්ම ඉඩ ප්‍රස්ථා නොලැබෙන ආකාරයේ වැඩසටහන් සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.77/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය සේවයේ විශ්‍රාමකයින්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— 2006/6 වැටුප් ප්‍රතිශෝධන චක්‍ර ලේඛයට අනුව 2006.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය සේවකයන්ගේ වැටුප් පරිවර්තනය කිරීම නිසා 2006.06.01 දිනට පෙර විශ්‍රාම ගිය සහ ඉන්පසු විශ්‍රාම ගිය රාජ්‍ය සේවකයන් අතර දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින් එය ඉවත් කිරීමට ජාතික වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.78/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— දිස්ත්‍රික් මට්ටමින් තොරතුරු මධ්‍යස්ථාන ඇති කිරීම,— භූගෝලීය පිහිටීම, ඓතිහාසික පසුබිම, වගාකරන භෝග වර්ග, මාර්ග පද්ධතිය, රජයේ කාර්යාල, පාසල්, විශ්වවිද්‍යාල, දුම්රිය ස්ථාන සහ බස් නැවතුම් පොළවල් ආදි සියලුම තොරතුරු පරිගණක ගත කරන ලද හා ලේඛන ගත කරන ලද තොරතුරු මධ්‍යස්ථාන ඇති කිරීමටත්, එහි පළමු පියවරේදී පළාත් මට්ටමින්, දෙවැනි පියවර ලෙස දිස්ත්‍රික් මට්ටමින් සහ තෙවැනි පියවර ලෙස ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ මට්ටමින් මෙම මධ්‍යස්ථාන ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.79/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—ශ්‍රී ලංකාවේ දහම් පාසල් අධ්‍යාපනය හා පරිපාලනය විධිමත් කිරීම,— ශ්‍රී ලංකාවේ සියලුම ආගම්වල දහම් පාසල් අධ්‍යාපනය හා පරිපාලනය වඩාත් විධිමත් කිරීමට සහ බෞද්ධ දහම් පාසල් තුළ පවත්නා දහම් අවසාන හා ධර්මාචාර්ය විභාග මෙන්ම සියලුම ආගම්වල දහම් පාසල් තුළ පැවැත්වෙන ඒ හා සමාන විභාග සහතික පත්‍ර සඳහා නිසි පිළිගැනීමක් ලබා දීමට, දහම් පාසල් සඳහා අඛණ්ඩව මානව සම්පත් හා භෞතික සම්පත් ලබා දීමෙන් දහම් පාසල් සඳහා පැමිණෙන සිසුන් සංඛ්‍යාව වැඩි කිරීමට කඩිනම් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.80/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—සුනඛයින්, බළලුන් වැනි සුරතල් සතුන් ඇති කිරීම සම්බන්ධ නීති සම්පාදනය,— නිවෙස්වල හෝ අලෙවි කිරීම සඳහා ඇති කරන සුනඛයින්, බළලුන් වැනි සුරතල් සතුන් පළාත් පාලන ආයතනවල ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතු අතර, එම සතුන්ගේ පැටවුන් අලෙවි කිරීම නීත්‍යානුකූලව අවසර ලත් මධ්‍යස්ථානවලදී පමණක් සිදු කළ යුතු බවත්, එසේ නොවන ස්ථානවල ඇති කරන ගැහැණු සතුන් අනිවාර්යයෙන්ම වන්ද්‍යාකරණයට ලක් කිරීමටත්, අවශ්‍ය නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 81/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රැකියා වෙළඳපොළට අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීම—, අනාගත ශ්‍රී ලංකාවේ බිහිවන නව රැකියා අවස්ථා සඳහා අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීමේ ක්‍රමවේදයකට මුල පිරීමේ කාර්යය වඩාත් කාර්යක්ෂම ලෙස රට තුළ පවත්නා සියලුම තෘතීක අධ්‍යාපන ආයතන මගින් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 82/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරීම,— දැනට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් ග්‍රාම නිලධාරී වසම් යළි සීමා නිර්ණය කිරීම සඳහා කටයුතු කරගෙන යමින් සිටින බැවින් එසේ සීමා නිර්ණය කරනු ලබන ග්‍රාම නිලධාරී වසම් තුළින් නව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ සීමා සහ නව දිස්ත්‍රික් සීමා නිර්ණය කළ යුතු බවත්, මෙසේ නිර්ණය කරනු ලබන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය පළාත් පාලන ආයතන බල ප්‍රදේශය බවට පත්කළ යුතු අතර එකී බල ප්‍රදේශයට කොට්ඨාස අධ්‍යාපන බල ප්‍රදේශය, පොලිස් බල ප්‍රදේශය, ගොවිජන සේවා බල ප්‍රදේශය, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා නිලධාරී බල ප්‍රදේශය ඇතුළු සියලු රාජ්‍ය ආයතනයන්හි බල ප්‍රදේශ සීමා සංයුක්ත වන පරිදි සමස්ත රාජ්‍ය ව්‍යුහයම ප්‍රතිසංවිධානය විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 83/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— නිල්වලා ගඟ ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධන කටයුතු යළි ආරම්භ කිරීම,— මාතර දිස්ත්‍රික්කයේ නිල්වලා ගඟ ව්‍යාපාරයේ සංවර්ධන කටයුතු අතර මග ඇන හිටීමෙන් එම මිටියාවතේ පෝෂක ප්‍රදේශයන්හි හව භෝග වගා කරන ජනතාවට මුහුණ පෑමට සිදුවී ඇති ගැටලු කඩිනමින් විසඳීමට පියවර ගත යුතු බවත්, නිල්වලා ගඟ ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධන කටයුතු කඩිනමින් යළි ආරම්භ කළ යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 84/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයිනගේ නිල කාලයට පසුද සාමවිනිසුරු පදවිය ලබාදීම,— පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින්ට දෙනු ලබන සාමවිනිසුරු තනතුරු ඔවුන්ගේ නිල කාලයට පමණක් සීමාවන බැවින්, නිල කාලයෙන් පසුවත් ඔවුන්ගෙන් එම සේවාව ලබා ගැනීම සඳහා පැමිණෙන විශාල පිරිසක් අපහසුතාවයට පත්වන බැවින්, එම මහජන නියෝජිතයන්ට තම නිල කාලයෙන් පසුවත්, සාම විනිසුරු තනතුරු ලබා දීම සඳහා සුදුසු වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 85/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සියළුම පළාත් සභා ජනතා නියෝජිතයන්ගේ දීමනා හා වරප්‍රසාද පිළිබඳව නැවත සලකා බැලීම,— දිවයිනේ දැනට ක්‍රියාත්මක වන පළාත් සභා හා ඉදිරියේදී විධිමත්ව ක්‍රියාත්මකවීමට නියමිත උතුරු පළාත් සභාවේ ගරු අමාත්‍යවරුන්, සභාපතිවරුන්, උපසභාපතිවරුන්, ආණ්ඩු පාර්ශ්වයේ සංවිධායකවරුන්, සභා නායකවරුන්, විරුද්ධ පාර්ශ්වයේ නායකවරුන්, විරුද්ධ පාර්ශවයේ ප්‍රධාන සංවිධායකවරුන් සහ ගරු මන්ත්‍රීවරුන්ගේ දීමනා, වරප්‍රසාද හා පහසුකම් ක්‍රමවත් තත්වයක නොපවතින බැවින් මේ පිළිබඳව ගැඹුරින් සලකා බලා ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 86/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන ආයතන වල සියලුම මහජන නියෝජිතයින්ගේ දීමනා හා වරප්‍රසාද පිළිබඳ නැවත සලකා බැලීම,—දිවයිනේ ක්‍රියාත්මක වන හා ඉදිරියේදී ක්‍රියාත්මකවීමට නියමිත සියලුම මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභාවන්හි පුරපතිවරයන්, නගරාධිපතිවරයන්, සභාපතිවරයන්, නියෝජ්‍ය පුරපතිවරයන්, නියෝජ්‍ය නගරාධිපතිවරයන්, උප සභාපතිවරුන්, විපක්ෂනායකවරයන් හා මන්ත්‍රීවරයන්ගේ දීමනා, වරප්‍රසාද සහ අනෙකුත් පහසුකම් ක්‍රමවත් තත්වයක නොපවතින බැවින් මේ පිළිබඳව ගැඹුරින් සලකා බලා ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.87/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— උතුරු නැගෙනහිර අතුරුදහන් වූ දෙමළ ජනතාවට මරණ සහතික ලබා දීම,— උතුරු නැගෙනහිර ප්‍රදේශවල යුද්ධය පැවති පසුගිය දශක තුනක පමණ කාලය තුළ විවිධ හේතුන් නිසා අතුරුදහන් වී ඇති පුද්ගලයන් මේ වන විට ජීවතුන් අතර සිටී ද නැද්ද යන්න කඩිනමින් පරීක්ෂණ පවත්වා ඔවුන් ජීවතුන් අතර නොමැති නම් ඔවුන් සඳහා මරණ සහතික ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 88/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම,— සියළුම දේශපාලන පක්ෂ නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත විශේෂ කාරක සභාවක් පත්කොට ශ්‍රී ලංකාවට යෝග්‍යවූ ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම ආරම්භ කළ යුතුයැයි ද, ඒ සඳහා ඒ හා සබැඳි සියලු ක්ෂේත්‍රයන් නියෝජනය වන පරිදි ප්‍රවීණයන්, උගතුන් හා බුද්ධිමතුන්ගෙන් මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි සහාය ලබා ගත යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 89/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— රජයේ පාසල් හා විශ්වවිද්‍යාල නිවාඩු දිනවලදී එම මධ්‍යස්ථාන අධ්‍යාපන ඒකක සඳහා ලබාදීම,—රජයේ පාසල් නිවාඩු කාලයේදී සහ සවස් වරුවලත් විශ්වවිද්‍යාල නිවාඩු දිනවලත් එම මධ්‍යස්ථාන මුල් කොට ගෙන ව්‍යාපාරික ප්‍රජාව, රාජ්‍ය නොවන සංවිධාන, වාණිජ මණ්ඩල, ප්‍රජා මූල සංවිධාන සම්බන්ධ කර ගන්නා වූ පුළුල් වැඩ පිළිවෙළක් වශයෙන් වැඩිහිටි හා නොවිධිමත් අධ්‍යාපන ඒකක සහනදායී ගාස්තු පදනමක් මත ආරම්භකළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 90/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— පුරප්පාඩු වන ග්‍රාම නිලධාරී තනතුරු වල වැඩ බැලීමේ පත්වීම් සඳහා කාර්යක්ෂම වැඩ පිළිවෙළක් සකස් කිරීම,— ග්‍රාම නිලධාරී තනතුරක පුරප්පාඩු ඇති වූ විට ආසන්න ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරීවරයා වැඩ බැලීම සඳහා පත් කරනු ලබන්නේ ඉතා සුළු දීමනාවක් යටතේ බැවින් ද, මෙම වැඩ බැලීමේ පත්වීම් තුළින් ග්‍රාම නිලධාරී වසම් දෙකෙහිම කාර්යක්ෂමතාව බිඳ වැටෙන බැවින්ද, එම තත්වය මග හරවා ගැනීම සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ග්‍රාම නිලධාරී සංචිතයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ පිහිටුවිය යුතු අතර පුරප්පාඩු සිදුවන වසම සඳහා එකී සංචිතය තුළින් ග්‍රාම නිලධාරීන් පත් කිරීම සහ එම සංචිතය තුළ සිටින ග්‍රාම නිලධාරීන්ට ප්‍රාදේශීය ලේකම් විසින් පවරනු ලබන වෙනත් ඵලදායී ක්ෂේත්‍ර හෝ රාජකාරී සඳහා යෙදවීමේ වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 91/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— වර්තමානයේ ක්‍රියාත්මක වන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දීම,— සෑම ග්‍රාම නිලධාරී වසමකම පිහිටා ඇති ආගමික සිද්ධස්ථානයන්හි නායක ස්වාමීන්වහන්සේ, පූජකතුමා, විදුහල්පතිතුමා, ග්‍රාම නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම පර්යේෂණ සහකාරවරයා, ජන සභා ලේකම්වරු, ප්‍රදේශයේ පොලිස් ස්ථානය නියෝජනය කරන නිලධාරියකු සහ එම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ස්වේච්ඡා සංවිධාන, රාජ්‍ය හා පෞද්ගලික අංශ වල සේවය කරන අදාළ වසමේ පදිංචිව සිටින නියෝජිතයින්ගෙන් සමන්විත සිවිල් ආරක්ෂක කමිටු ගොඩනැගීමට වඩාත් පහසුවීම සඳහා වර්තමාන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දිය හැකි පරිදි පාර්ලිමේන්තු පනතක් සම්මත කළ යුතු යැයි ද, ඒ තුළින් ග්‍රාම නිලධාරී වසම තුළ සිදුවන අපරාධ හා දූරාචාර, නීති විරෝධී කටයුතු පිළිබඳ අදාළ අංශ සමඟ මනා සම්බන්ධීකරණයක් ගොඩනැගීමට හැකි වන පරිදි අදාළ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 92/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— දිවයින තුළ දැනට ක්‍රියාත්මක වන යල් පැන ගිය නීති අණපනත් යාවත්කාලීන කිරීම,— ශ්‍රී ලංකාවේ මේ වනවිටත් අධිරාජ්‍යවාදී යුගයේදී හඳුන්වාදෙන ලද නීති අණපනත් ක්‍රියාත්මකවන බැවින් එම නීති අණපනත් යළි අධ්‍යනය කිරීමේ කමිටු පත්කර, යල් පැනගිය දඩුවම්, දඩ මුදල් ආදිය යාවත්කාලීන කිරීමේ ජාතික වැඩපිළිවෙලක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 93/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලු මැතිවරණ එකම දිනක පැවැත්වීම,— ශ්‍රී ලංකාව තුළ 1988 සිට 2010 දක්වා වසර 22 ක කාලය තුළ 1990, 1992, 1995, 1996, 1998, 2003 සහ 2007 වසරවලදී හැර අන් සෑම වසරකදීම කිසියම් මැතිවරණයක් පවත්වා ඇති අතර, එසේ මැතිවරණ පැවැත්වීම ජනතා මතය සලකා බැලීම සඳහා වටිනා නිර්ණායකයක් වුවද, මේ තුළින් රටේ ආර්ථිකය, පරිපාලනය ආදි සෑම ක්ෂේත්‍රයකටම දැඩි බලපෑමක් ඇති කරන බැවින් පළාත් පාලන මැතිවරණ, මහා මැතිවරණ සහ ජනාධිපතිවරණය එකම දිනයකදී පැවැත්වීමට හැකි වන පරිදි එකී ආයතනවල නිල කාලය සංශෝධනය කිරීමටත්, ගැලපෙන මැතිවරණ ක්‍රමවේදයක් නිර්මාණය කිරීමටත් සුදුසු පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 94/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම,— රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව පාර්ලිමේන්තුව හා පළාත් සභා අතරත්, පළාත් සභා හා පළාත් පාලන ආයතන අතරත් මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම අත්‍යාවශ්‍ය වන අතර ඒ සඳහා පළාත් පාලන ආයතන ප්‍රධානීන්, පළාත් සභා තුළ නියෝජනයවීම සහතිකවනු පිණිස ද, පළාත් සභා ප්‍රධානීන් පාර්ලිමේන්තුව තුළ නියෝජනය වීම සහතිකවනු පිණිසද ක්‍රමවේදයක් සකස් කිරීමට අවශ්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 95/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ඒකාග්‍රතාව ඇති කිරීමට පියවර ගැනීම,— ජාතික ඒකාග්‍රතාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දෙමළ භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල සිංහල භාෂා පුහුණු වැඩ සටහන් ද, සිංහල භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල දෙමළ භාෂා පුහුණු වැඩසටහන් ද, රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික ආයතනයන්හි සහයෙන් ක්‍රියාත්මක විය යුතු අතර රාජ්‍ය හා පෞද්ගලික විද්‍යුත් මෙන්ම මුද්‍රිත මාධ්‍ය ආයතනවල සහයෝගය ලබාගනිමින් මෙම පුහුණු වැඩ සටහන් ආරම්භ කිරීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 96/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— කලත්‍රයාගේ නොමනා ක්‍රියා නිසා අසරණභාවයට පත්වන පාර්ශවයට සහන සලසා දීම,— විවාහක අඹුසැමි යුවලක් එකම වහලක් යට ජීවත්ව සිටින අවස්ථාවලදී පුරුෂයා හෝ බිරිඳ සුරාව, සූදුව සහ වෙනත් අපචාරී කටයුතුවල යෙදෙමින් ඉඩම් හෝ ගේ දොර බඩු මුට්ටු තම පෞද්ගලික අභිමතය පරිදි විකුණමින් හෝ අන් අයට පවරමින් හැසිරීම නිසාවෙන් අනෙක් පාර්ශවයත් සමඟ දරුවන් දැඩි අසරණභාවයට පත් වන අවස්ථාවලදී එම තත්වය වළක්වා ගැනීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 98/’10

ගරු බුද්ධික පතිරණ මහතා,—චර්යා ධර්ම පිළිබඳ කාරක සභා ඇතිකිරීම,— ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්වාසවන්තභාවය හා ඔවුන් තුළ උසස් ආචාර ධර්ම පවත්වාගෙන යාමේ අවශ්‍යතාව නිසා ඒ පිළිබඳ කරුණු සොයා බැලීම සඳහා චර්යා ධර්ම පිළිබඳ කාරක සභාවක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 99/’10

ගරු බුද්ධික පතිරණ මහතා,—නව ඉලෙක්ට්‍රොනික් හැඳුනුම්පතක් නිකුත් කිරීම,— පරිපාලනය පහසු කිරිම, අපරාධ මැඩලීම සඳහා හා වෙනත් වංචනික ක්‍රියාවලට යොමුවීම අවමකිරීම සඳහා අදාළ පුද්ගලයාගේ රුධිර ගණය, බැංකු ගිණුම්, ක්‍රෙඩිට් කාඩ්, අධ්‍යාපන සුදුසුකම්, රියදුරු බලපත්‍ර හා විදේශ ගමන් බලපත්‍ර අංක ආදී වැදගත් හා අවශ්‍ය තොරතුරු ඇතුළත් නව ඉලෙක්ට්‍රොනික අංකයක් සහිත ජාතික හැඳුනුම්පතක් නිකුත් කළ යුතු බවත් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයන්හි ජීවත්වන සියලු දෙනාගේ තොරතුරු ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් පරිගණකගත කිරීම කඩිනමින් කළ යුතු බවත් එම තොරතුරු වරින්වර යාවත්කාලීන කළයුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 100/'10

ගරු බුද්ධික පතිරණ මහතා, — පොලිස් නිලධාරීන්ට ද අවුරුදු විස්සක සේවා කාලයකින් පසු විශ්‍රාම යාමට අවස්ථාව ලබාදීම, — පොලිස් දෙපාර්තුමේන්තුවේ කාන්තා පොලිස් නිලධාරිනියන් සඳහා වන විසි වසරක සේවා කාලයකින් පසු ස්ව කැමැත්තෙන් විශ්‍රාමයාමේ හැකියාව, පොලිස් නිලධාරීන් සඳහා ද අදාළ වියයුතු යැයි ද ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 101/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කිරීම ,—රෙගුලාසි තැනීම මෙන්ම රෙගුලාසි ඉවත් කිරීමද නිතර සිදුවන ක්‍රියාවලියක් බැවින් කල්පැන ගිය රෙගුලාසි ඉවත් කිරීම පිළිබඳ සොයා බැලීම සඳහා රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 102/'10

ගරු බුද්ධික පතිරණ මහතා, — සිවිල් ආරක්ෂක බලකායට අයත් නිලධාරීන්/ නිලධාරිනියන් සේවයේ ස්ථිර කිරීම, — සිවිල් ආරක්ෂක බලකායට අයත් නිලධාරීන් හා නිලධාරිනියන් සඳහා ද රජයේ අනෙකුත් ආරක්ෂක අංශවල සේවයේ නියුතු නිලධාරීන් හා නිලධාරිනියන්ට මෙන් වැටුප්, දීමනා, ස්ථිර සේවය සහ විශ්‍රාම වැටුප් සහිත රජයේ වෙනත් දෙපාර්තුමේන්තුවල මෙන් පිළිගත් නිල තත්ත්වයක් ලබාදිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 103/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—සහතික වීම පිළිබඳ කාරක සභා ඇති කිරීම,— පාර්ලිමේන්තුවේ අසන ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් රජය දෙන සහතික හා රජයේ බැඳීම් ඇතැම් විට කඩ වන අවස්ථා දක්නට ලැබෙන බැවින්, රජය සිය වගකීම් ඉටු කරන බවට සහ ඒවා පිළිබඳව වගකියන බවට සහතික වීම සඳහා සහතික වීම පිළිබඳ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 104/'10

ගරු. (අල්හාජ්) ඒ.එච්.එම්. අස්වර් මහතා,— තල් ගස් වගාව දිරිමත් කිරීම,— "කප්පගතරු" යන නමින් හැඳින්වෙන පොදු ජනතාවට ඉමහත් ප්‍රයෝජනවත් වන තල් ගස් වගාව දිරිමත් කිරීමෙන් තල් ආශ්‍රිත නිෂ්පදන ප්‍රවර්ධනයට සියලු පියවර ගත යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 105/'10

ගරු බුද්ධික පතිරණ මහතා, — දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඵලදායීතාව වැඩිකර ගැනීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඇති අනවසර ඉදිකිරීම් හා අනවසර පදිංචිකරුවන් කඩිනමින් ඉවත්කර නීත්‍යානුකූල ඉදිකිරීම් සම්බන්ධ ගිවිසුම් නැවත සමාලෝචනය කිරීමෙන් දෙපාර්තමේන්තුවට ලැබෙන ආදායම් වර්ධනය කළ යුතු අතර, දෙපාර්තමේන්තුවේ සංවර්ධන කටයුතු සඳහා සෘජුවම බල නොපාන්නා වූ ඉඩම් දිගුකාලීන බදු පදනමක් මත පෞද්ගලික අංශයට ලබාදී එම මුදල් දුම්රිය පද්ධතිය නවීකරණය සඳහා යොදා ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.108/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— යාචකයින්ගේ ජීවිත ආරක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— මේ වන විට යාචකයින්ගේ ජීවිතවලට විශාල ලෙස තර්ජන එල්ල වී තිබෙන බැවින් ඔවුන්ගේ ජීවිතවල සුරක්ෂිතතාව රැකදීම උදෙසා, ඔවුන්ට වගා කිරීම සඳහා ඉඩම් ලබා දී ඉන් ලැබෙන ආදායමෙන් ඔවුන්ගේ ජීවිතවල ආරක්ෂාව හා පෝෂණය සහතික කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.109/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීමේ අරමුණින්, රජය මගින් භූමි ප්‍රමාණයක් වෙන්කොට එම ස්ථානයට නිදැල්ලේ යන සුනඛයින් ගෙන ගොස් ඔවුන් රැක බලාගැනීම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.110/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ළමා අපචාර සිද්ධීන් සඳහා දැඩි දඬුවම් පැනවීම,— දිවයින පුරා ළමා අපචාර හා අපයෝජනයන් දිනෙන් දින සීඝ්‍රයෙන් වර්ධනය වීමේ තත්ත්වයක් ඇති වී තිබෙන බැවින් ඒ සම්බන්ධව දැනට පවත්නා නීති රෙගුලාසි ප්‍රමාණවත් නොවන්නේ නම්, නව නීති රෙගුලාසි අලුතින් සම්මත කොට ඉතා කඩිනමින් මේ සම්බන්ධ නඩු විසඳීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.111/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා වෙරළ පිවිසුම් මාර්ග ඇති කිරීම,— දිවයිනේ වෙරළබඩ කලාපය තුළ සීඝ්‍රයෙන් සිදුවන ඉදිකිරීම් නිසාවෙන් දේශීය, විදේශීය සංචාරකයන්ට මෙන්ම ධීවරයන්ට ද වෙරළ තීරයට පිවිසීමේදී අවහිරතා ඇතිව තිබීම සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනයට මෙන්ම ධීවර කර්මාන්තයට ද බාධා ගෙන දෙන බැවින් එම තත්ත්වය වළක්වාලීම සඳහා මෙන්ම මෙම ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව වෙරළ පිවිසුම් මාර්ග පද්ධතියක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.112/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— විදුහල්පති සේවය, ගුරු අධ්‍යාපන සේවය, අධ්‍යාපන පරිපාලන සේවය යන සේවාවල දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින්, එම තත්ත්වය මඟ හරවා ඔවුන්ගේ ආත්මාභිමානයට සරිලන වැටුපක් ලැබෙන පරිදි වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.113/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ භික්ෂු අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම,— බෞද්ධ භික්ෂූන්වහන්සේලාගේ ධර්ම ඥානය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව උන්වහන්සේලාගේ කථන හැකියා, ශ්‍රවණ හැකියා, පරිගණක, මනෝවිද්‍යාත්මක සහ උපදේශනය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම උදෙසා දැනට පවත්නා භික්ෂු අධ්‍යාපන ආයතනවලට පරිබාහිරව මෙම කටයුතු සඳහාම වෙන් වූ භික්ෂු අධ්‍යාපන ආයතන ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.114/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ දැනට ක්‍රියාත්මක වන නොතාරිස් සේවාව යාවත්කාලීන කිරීම,— දිවයින තුළ ක්‍රියාත්මක වන නොතාරිස් සේවය යල්පැන ගිය නීතිවලින් සකස් වී ඇති නිසා ඒ පිළිබඳව යළි සලකා බලා වර්තමානයට ගැලපෙන ලෙස නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.115/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— වියළි කලාපීය හේන් ගොවීන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— වියළි කලාපීය ප්‍රදේශවල හේන් ගොවීන් විසින් වගා කරනු ලබන වී, කුරක්කන්, මුං, තල වැනි වගාවන්හි අස්වැන්න වැඩි කර ගැනීම සහ නිෂ්පාදන සකස් කිරීම සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම තුළින් උසස් ගුණාත්මක තත්ත්වයෙන් යුතු නිෂ්පාදන සකස් කිරීම සඳහාත්, දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ තුළ නිෂ්පාදන අලෙවි කර ගැනීමේ පදනම ශක්තිමත් කර ගැනීම සඳහාත් සීමිත සමූපකාර සමාගම් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.116/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ගුරු උපදේශක සේවාවක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණ ඇතිව මීට වසර විස්සකට(20) පමණ පෙර සිට ආරම්භ වී ක්‍රියාත්මක වන ගුරු උපදේශක තනතුරු වෙනම ගුරු උපදේශක සේවා ඒකකයක් ලෙස ස්ථාපනය කල යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.117/'10

ගරු රුවන් රණතුංග මහතා,— අතුරු බෙදීම් තහනම් නිකුත්කර ඇති රජයේ දීමනා පත්‍ර ඉඩම්වල අතුරු බෙදීමේ බලය ප්‍රාදේශීය ලේකම්වරුන්ට පැවරීම,— ජය භූමි, ස්වර්ණ භූමි, රත්න භූමි ආදී රජයේ ඉඩම් දීමනා පත්‍රලාභීන්ගේ ඉඩම්වල අතුරු බෙදීම් තහනම් වුවත්, මුල් ඉඩම්ලාභීන්ගේ දෙවන පරම්පරාවේ අයිතිය තහවුරු කිරීමටත්, ඔවුන්ගේ ගේ දොර වතුපිටිවල සංවර්ධන කටයුතු කිරීමටත් අතුරු බෙදීම් අවශ්‍යතා පැන නැගුණු විට, පළාත් කොමසාරිස්, ඉඩම් කොමසාරිස් සහ ජනාධිපති ලේකම් කාර්යාලය හරහා දැනට ක්‍රියාත්මක වන දීර්ඝ ක්‍රියාවලිය අවම කොට අතුරු බෙදීමේ බලය ප්‍රාදේශීය ලේකම්වරුන්ට පැවරීමට අවශ්‍ය නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.118/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— තිරිඟු පිටි වෙනුවට සහල් පිටි ජනතාව අතර ජනප්‍රිය කරවීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම,— තිරිඟු පිටි සඳහා විදේශ රටවලට ඇදී යන විශාල ධනස්කන්ධය නවතාලීමේ අරමුණ ඇතිව ආදේශකයක් ලෙස භාවිතා කළ හැකි සහල් පිටිවලින් සැකසූ ආහාර ප්‍රචලිත කිරීම සඳහාත්, කෙඳි සහිත ධාන්‍ය වර්ගයක් වන සහල් වඩාත් සියුම් ලෙස තිරිඟු පිටි මෙන් අඹරා ගැනීම සඳහාත්, තිරිඟු පිටි ඇඹරීමට භාවිතා කරන ආකාරයේ යන්ත්‍ර සූත්‍ර සහ නව තාක්ෂණය හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.119/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— යුද්ධය නිසා ආබාධිතයන් බවට පත්වූවන්ට සහන සලසා දීම,— වසර 30කට ආසන්න කාලයක් පැවැති යුද්ධය හේතුකොට ගෙන එදිනෙදා කුලී වැඩ කොට ජීවත් වූ ජනතාවත් ස්ථිර රැකී රක්ෂා කළ ජනතාවත් අතුරින් සැලකිය යුතු ප්‍රමාණයක් අංගවිකලව ආබාධිතව ජීවන බරින් මහත් පීඩාවට පත් වී අසරණව ජීවත් වන බැවින්, ඔවුන් සඳහා යම් මාසික දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.120/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලුම ප්‍රභූ ආරක්ෂකයින් සඳහා ගමන් වියදම් දීමනාවක් ලබා දීම,— ජනාධිපති ආරක්ෂක සහ අගමැති ආරක්ෂක සේවයේ නියුක්ත නිලධාරීන්ට මෙන්ම අනෙකුත් ප්‍රභූ ආරක්ෂක සේවාවල නියුක්ත නිලධාරීන්ට ද සමාන ගමන් වියදම් දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.122/'11

ගරු රුවන් රණතුංග මහතා,— රාජ්‍ය බැංකුවල පොලී ගෙවීම සහ පොලී අයකිරීම අතර පවතින පරතරය අඩු කිරීම,— රාජ්‍ය බැංකුවල සාමාන්‍ය ඉතුරුම් තැන්පතු සඳහා ගෙවන පොලී අනුපාතය 4 % සිට 4.5 % දක්වාද ස්ථාවර තැන්පතු සඳහා ගෙවන පොලී අනුපාතය 8 % පමණ ද වන අතර බැංකු විසින් නිවාස, ව්‍යාපාරික සහ කෘෂිකාර්මික වැනි ණය සඳහා අය කරනු ලබන පොලී අනුපාතය 12 % සිට 13 % ක් ද පමණ වන බැවින් ජනතාවට සහ කුඩා පරිමාණ ව්‍යාපාරිකයන්ට අතදීම සඳහාත් ඔවුන් දිරිගැන්වීම සඳහාත් මෙම අයකරන පොලිය සහ ගෙවන පොලිය අතර පවතින පරතරය අඩුකිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.123/'11

ගරු රුවන් රණතුංග මහතා,— උපාධිධාරී ග්‍රාම නිලධාරීන් අගැයීම සඳහා දීමනාවක් ලබා දීම,— රාජ්‍ය සේවය ගම් මට්ටමින් ජනතාවට ලබා දීම සඳහා සේවය කරන ග්‍රාම නිලධාරීන් අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් පසුව තරඟ විභාග ලකුණු මත බඳවා ගෙන ඇතත්, දැනට සේවයේ යෙදී සිටින ග්‍රාම නිලධාරීන් අතුරින් 30 % ක් 40 % ක් පමණ පිරිසක් උපාධි සුදුසුකම් ලබා ඇති අතර එයට කිසිදු සැලකිල්ලක් මෙතෙක් දක්වා නැති බැවින් උපාධි සුදුසුකම අගැයීම සඳහා උපාධිධාරී ග්‍රාම නිලධාරීන්ට වැටුප් වැඩිවීමක් හෝ දීමනාවක් ලබා දීමට අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.124/'11

ගරු රුවන් රණතුංග මහතා,— ශාස්ත්‍රීය ග්‍රන්ථවල හැර දෛනික පුවත්පත් සහ වාර සඟරාවල බුද්ධ රූපය පළ කිරීම තහනම් කිරීම,— දෛනික පුවත්පත්වල සහ වාර සඟරාවල බුද්ධ රූප සහ ප්‍රතිමා රූප කිසිදු පාලනයකින් තොරව අසීමිතව මුද්‍රණය කෙරෙන අතර එම පත්‍රිකා විවිධ භාණ්ඩ දවටන සහ වෙනත් අයෝග්‍ය කටයුතු සඳහා භාවිතා කිරීම බුදුරජාණන්වහන්සේට අගෞරවයක් වන බැවින් 2600 වැනි සම්බුද්ධ ජයන්තිය සැමරීම ද සැලකිල්ලට ගෙන මින් ඉදිරියට ශාස්ත්‍රීය ග්‍රන්ථවල හැර දෛනික පුවත්පත්, වාර සඟරා සහ වෙනත් පත්‍රිකාවල බුද්ධ රූප සහ ප්‍රතිමා රූප පළ කිරීම තහනම් කිරීම සඳහා අවශ්‍ය නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2011 ජූලි මස 08 වැනි සිකුරාදා)**

0183/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) සූරියවැව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය, ඉඩමේ ස්වභාවය හා වාර්ෂික ආදායම කොපමණද;

(iii) එම ඉඩම්වල අයිතිය නිත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(iv) ඒ කවර කාර්යයක් සඳහා කවර පදනමකින්ද;

(v) එම පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය, කාල සීමාව හා කොමිෂන් සභාවට වාර්ෂිකව ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නිත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම්, ඉඩම් ප්‍රමාණය සහ ඒ කවදා සිටද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා 2009.08.01 දිනට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම්, ලිපිනයන් සහ ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0882/'10

ගරු රාජීව විජේසිංහ මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) 2010 ජුලි 29 වැනි දින 'ඩේලි මිරර්' පත්‍රයේ පලවූ ලිපියක, ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය පිළිබඳ නීති සංශෝධනය වෙනුවෙන් අරගල කරන සමහර රාජ්‍ය නොවන සංවිධාන අධික ලෙස මත්ද්‍රව්‍ය භාවිතය වැනි නීති විරෝධී කටයුතු වල යෙදෙන බව සඳහන් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) නීති විරෝධි කටයුතු පිළිබඳ තොරතුරු ඇති හා ඒවා විශේෂ අවධානයට ලක් කරනු ලබන පුවත්පත්වලින් එවන් ක්‍රියාකාරකම් පිළිබඳව ඔවුන් සතුව ඇති සාක්ෂි පිළිබඳව ප්‍රශ්න කිරීමට; හා

(ii) නීතිය ආරක්ෂා කළ යුතු බවට එවන් පුවත්පත් වලට දැනුම්දීමටත්, නීතියේ වෙනස්කම් තිබීම පිළිගතහැකි පිළිවෙතක් බවත්, අසංවර වචන භාවිතා කොට ඒවාට පහර නොදිය යුතු බවත් දැනුම්දීමට අවශ්‍ය පියවර එතුමා ගන්නෙහිද?

(ඇ) (i) ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය පිළිබඳ කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නීති කොමිසමේ අදහස් උක්ත ලිපියේ ඇතුළත්ද;

(ii) නිර්දේශ කොට ඇති නීති සංශෝධන ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය කෙතරම් කාලයක් ගැනීමට බලාපොරොත්තු වන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0903/'10

ගරු මොහමඩ් අස්ලම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) අළුත්ගම, දර්ගා නගරය, ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ අනුයුක්ත කථිකාචාර්යවරයෙකු ලෙස සේවය කරන එම්. ආර්. එම්. සිල්මි මහතා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වැනි පන්තියට අන්තර්ග්‍රහණය කිරීම සඳහා 2000/11/05 දින සම්මුඛ පරීක්‍ෂණයට ඉදිරිපත් වූ බවත්;

(ii) සුදුසුකම් සියල්ල සපුරා තිබුනත් කළුතර කලාප අධ්‍යාපන කාර්යාලයේ ඔහුගේ පෞද්ගලික ලිපි ගොනුව සම්පූර්ණ කර නොතිබීම සහ නිසි ලෙස නඩත්තු නොකිරීම නිසා ඒ මහතාට අපේක්‍ෂිත උසස්වීම නොලැබූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) අංක 82/2000 සහ 2000/08/24 දිනැති අමාත්‍ය මණ්ඩලයේ තීන්දුව අනුව උසස් වීම් ලැබීම සඳහා උපාධිලත් අනුයුක්ත කථිකාචාර්යවරයෙකු 2000/08/24 දිනට වසර 5ක සේවා කාලය සම්පූර්ණ කර තිබීමේ අවශ්‍යතාව, ශාස්ත්‍රපති උපාධිධාරියෙකු (M.A) වූ සිල්මි මහතා 2000/07/11 දිනය වන විටත් සම්පූර්ණ කර තිබූ බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) එසේ නම්, සිල්මී මහතාට එකී උසස්වීම ලබා දීම තවදුරටත් ප්‍රමාද කිරීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) 2000/12/08 දින සිට ක්‍රියාත්මකවන පරිදි සිල්මී මහතා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කොට, එම තනතුරට අදාළ වැටුප් තලය අනුව සියලු හිඟ වැටුප් සහ දීමනා නොපමාව ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0184/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය, ඉඩමේ ස්වභාවය හා වාර්ෂික ආදායම කොපමණද;

(iii) එම ඉඩම්වල අයිතිය නිත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(iv) ඒ කවර කාර්යයක් සඳහා කවර පදනමකින්ද;

(v) එම පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය, කාල සීමාව හා කොමිෂන් සභාවට වාර්ෂිකව ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නිත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම්, ඉඩම් ප්‍රමාණය සහ ඒ කවදා සිටද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා 2009.08.01 දිනට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම්, ලිපිනයන් සහ ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0185/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය, ඉඩමේ ස්වභාවය හා වාර්ෂික ආදායම කොපමණද;

(iii) එම ඉඩම්වල අයිතිය නිත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(iv) ඒ කවර කාර්යයක් සඳහා කවර පදනමකින්ද;

(v) එම පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය, කාල සීමාව හා කොමිෂන් සභාවට වාර්ෂිකව ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නිත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම්, ඉඩම් ප්‍රමාණය සහ ඒ කවදා සිටද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා 2009.08.01 දිනට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම්, ලිපිනයන් සහ ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0186/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය, ඉඩමේ ස්වභාවය හා වාර්ෂික ආදායම කොපමණද;

(iii) එම ඉඩම්වල අයිතිය නිත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(iv) ඒ කවර කාර්යයක් සඳහා කවර පදනමකින්ද;

(v) එම පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය, කාල සීමාව හා කොමිෂන් සභාවට වාර්ෂිකව ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නිත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම්, ඉඩම් ප්‍රමාණය සහ ඒ කවදා සිටද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා 2009.08.01 දිනට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම්, ලිපිනයන් සහ ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0778/'10

ගරු අජිත් කුමාර මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පූර්ව අනුමැතියකින් තොරව ශ්‍රී ලංකාවේ රුහුණු විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියක ලෙස වෛද්‍ය මිරානි වීරසූරිය මහත්මිය පත්කරනු ලැබූ බවත්;

(ii) මෙම විශ්වවිද්‍යාලයට සම්බන්ධ වීමට ප්‍රථම, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ඇය සේවයෙන් පහ කරනු ලැබ තිබූ බවත්;

(iii) මේ වන විට ඇය මෙම විශ්වවිද්‍යාලයෙහිම වෛද්‍ය පීඨයෙහි පරපෝෂිතවේදය පිළිබඳ මහාචාර්යවරියක ලෙස පත් කරනු ලැබ ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) තමා රජයේ සේවයෙන් පහ කරනු ලැබ තිබූ බව ඇය විශ්වවිද්‍යාල බලධාරීන්ට දැනුම් දී තිබුනේද;

(ii) පරපෝෂිතවේදය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරට පත් කරන අවස්ථාවේදී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද මූලික අධ්‍යාපන සුදුසුකම් ඇය සතුව තිබුනේද;

(iii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතෙහි 86(අ) වගන්තිය යටතේ, ඉහත කී පත්කිරීම් විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය වෙත යොමු කිරීමට පියවර ගනු ලබන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?